3
ශ්‍රේණිය


මූලික පිරිවෙන්

# භූගෝල විද්‍යාව

## මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර

Year End Papers


මූලික පිරිවෙන් මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii




මූලික පිරිවෙන් භූගෝල විද්‍යාව මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර

# භූගෝල විද්‍යාව

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය



# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

### 03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

භූගෝල විද්‍යාව I, II | කාලය : පැය තුන යි

Geography I, II | Time : Three Hours

### භූගෝල විද්‍යාව I

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ).

ii. අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න. 31 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති උපදෙස් අනුව කටයුතු කරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරයෙහි අංකයට සැසෙඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. භූගෝල විද්‍යාව යනු,

(i) පෘථිවිය පිළිබඳ හදාරන විෂයකි
(ii) විශ්වය පිළිබඳ හදාරන විෂයකි
(iii) ජීවීන් පිළිබඳ හදාරන විෂයකි
(iv) මානව වර්ගයා පිළිබඳ හදාරන විෂයකි

02. පෘථිවියේ ප්‍රධාන සංරචක නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(i) ශිලා ගෝලය, ජෛව ගෝලය හා තාප ගෝලය හා වායුගෝලය යි.
(ii) ජල ගෝලය, ශිලා ගෝලය හා මෙසෝ ගෝලය හා ජෛව ගෝලය යි.
(iii) වායු ගෝලය, ජෛව ගෝලය හා පරිවර්ති ගෝලය හා ජල ගෝලය යි.
(iv) ජෛව ගෝලය, ජල ගෝලය, වායු ගෝලය හා ශිලා ගෝලය යි.

03. පෘථිවි අභ්‍යන්තරය ප්‍රධාන කොටස් කීයකින් යුක්තවේ ද?

(i) 02කි.
(ii) 03කි.
(iii) 04කි.
(iv) 05කි.

04. ශ්‍රී ලංකාවේ කුඩා ම පරිපාලන ඒකකය වන්නේ,

(i) පළාත යි.
(ii) දිස්ත්‍රික්කය යි.
(iii) ග්‍රාමනිලධාරී කොට්ඨාසය යි.
(iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි.

05. ශ්‍රී ලංකාවේ විශාලතම දිස්ත්‍රික්කය වන්නේ,

(i) පොළොන්නරුව යි.
(ii) මොණරාගල යි.
(iii) අනුරාධපුර යි.
(iv) කුරුණෑගල යි.

06. ලංකාවේ කුඩා ම දිස්ත්‍රික්කය වන්නේ,

(i) කොළඹ යි.
(ii) කළුතර යි.
(iii) අනුරාධපුරය යි.
(iv) ගම්පහ යි.

07. ලංකාවේ උසම ස්ථානය අයත් දිස්ත්‍රික්කය වන්නේ,

(i) හම්බන්තොට යි.
(ii) නුවරඑළිය යි.
(iii) මහනුවර යි.
(iv) යාපනය යි.

08. ශ්‍රී ලංකාවේ ලෝක උරුමයක් ලෙස නම් කර ඇති වනාන්තරයක් අඩංගු පිළිතුර තෝරන්න.

(i) යාල (ii) විල්පත්තුව (iii) සිංහරාජය (iv) තබ්බෝව

09. ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ගංගාවලින් දිගින් වැඩිම ගංගාව වන්නේ,

(i) කැලණි ගඟ යි. (ii) වලවේ ගඟ යි.

(iii) මහවැලි ගඟ යි. (iv) කළු ගඟ යි.

10. වායුගෝලයේ ඇති වායුවර්ගවලින් වැඩිම ප්‍රතිශතයක් අඩංගු වායුව කුමක් ද?

(i) හයිඩ්‍රජන් (ii) නයිට්‍රජන් (iii) හීලියම් (iv) ආගන්

11. ලෝකයේ විශාලතම මිරිදිය විල කුමක් ද?

(i) සුපීරියර් විල (ii) ටිටිකාකා විල

(iii) බයිකල් විල (iv) ක්‍රේට විල

12. සෞරග්‍රහ මණ්ඩලයේ විශාලතම ග්‍රහයා වන්නේ,

(i) සෙනසුරු ය. (ii) පෘථිවිය (iii) බ්‍රහස්පති (iv) සිකුරු

13. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහ ලෝක අතරින් රැස් වලල්ලක් සහිත ග්‍රහ ලෝකය වන්නේ

(i) අඟහරු ය. (ii) සිකුරු ය. (iii) බුද ය. (iv) සෙනසුරු ය.

14. සෞරග්‍රහ මණ්ඩලයේ වැඩිම චන්ද්‍රයන් සංඛ්‍යාවක් සිටින ග්‍රහලෝකය වන්නේ

(i) සෙනසුරු ය. (ii) නෙප්චූන් ය. (iii) ප්ලූටෝ ය. (iv) බ්‍රහස්පති ය.

15. විශ්වයේ චක්‍රාවාට පිළිබඳ පැහැදිලි කරන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(i) ලෝක ධාතු විඥපාන සූත්‍රය (ii) අග්ගඤ්ඤ සූත්‍රය

(iii) අරුණවතී සූත්‍රය (iv) කරණිය මෙත්ත සූත්‍රය

16. පෘථිවියේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන

(i) 510කි (ii) 550කි (iii) 490කි (iv) 600කි

17. පෘථිවිය එක් වරක් භ්‍රමණය වීමට ගතවන කාලය නිවැරදි ලෙසම දක්වා ඇති අගය වන්නේ,

(i) පැය 24කි. (ii) පැය 23 මිනිත්තු 56 තත්පර 4කි.

(iii) පැය 24 මිනිත්තු 56 තත්පර 4කි. (iv) පැය 23 මිනිත්තු 57 තත්පර 16කි.

18. දැනට සොයාගෙන ඇති අන්දමට සෞරග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහලෝක ගණන වන්නේ,

(i) හතකි. (ii) අටකි. (iii) නවයකි. (iv) දහයකි.

19. (පෘථිවිය මත ඇඳ ඇති මනඃකල්පිත) අක්ෂාංශ රේඛාවලින් දිගම රේඛාව වන්නේ,

(i) අංශක 90 රේඛාව (ii) අංශක 0 රේඛාව

(iii) අංශක 30ත් 40ත් අතර රේඛාව (iv) දකුණු අක්ෂාංශ 90 රේඛාව

20. පෘථිවියේ නිවැරදිම පරිභ්‍රමණ කාලය වන්නේ,

(i) දින 365 පැය 6කි. (ii) දින 366කි.

(iii) දින 365 පැය 8කි. (iv) දින 365 තත්පර 6කි.

21. පෘථිවියේ ඉහළින්ම ඇති වායු ගෝල ස්ථරය කුමක් ද?

(i) මෙසෝගෝලය (ii) අපරිවර්තිගෝලය

(iii) තාප ගෝලය (iv) පරිවර්තිගෝලය

22. වායු ගෝලයේ ඇති වායුන්ගෙන් වැඩිම ප්‍රතිශතය ඇති වායුව වන්නේ

(i) හයිඩ්‍රජන් (ii) නයිට්‍රජන් (iii) කාබන්ඩයොක්සයිඩ් (iv) ඔක්සිජන්

23. පෘථිවියේ පාෂාණවලින් ඝණකමින් වැඩිම කොටස පිහිටා ඇත්තේ,

(i) පිටත හරයේ ය. (ii) පහළ ප්‍රාවරණයේ ය.

(iii) ඉහළ ප්‍රාවරණයේ ය. (iv) අභ්‍යන්තර කලාපයේ ය.

24. වසන්ත සෘතුවේ දී කැපීපෙනෙන පාරිසරික ලක්ෂණය ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යයි. ගස්වල දළු හා මල් හට ගනි. මුළු පරිසරයම ඉතා අලංකාරය

(ii) උෂ්ණත්වය ඉතාම අඩුය. දැඩි සීතලක් පවතී. මුළු පරිසරයම හිමෙන් වැසියයි.

(iii) උෂ්ණත්වය අධිකය ගස්වල කෙත් වතුවල ඵලහට ගැනීමත් ධාන්‍ය පැසීමත් හා දිවා කාලය දිගුවේ.

(iv) උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු වී යයි ගස්වල පත්‍ර පතනය වේ. මුළු පරිසරයම වියළි බවක් හටගනී.

25. වෙරළබඩ තැනිතලාවේ දැකිය හැකි භූ ලක්ෂණයකි.

(i) දළ බෑවුම් සහිත කඳු (ii) හුදකලා කඳු

(iii) මෝහොර ලක්ෂණ (iv) වැලිපර

26. පෘථිවියේ ඇති විශාලම මහාද්වීපය කුමක් ද?

(i) උතුරු ඇමරිකා මහාද්වීපය (ii) ආසියා මහාද්වීපය

(iii) අප්‍රිකා මහද්වීපය (iv) ඇන්ටාක්ටික් මහාද්වීපය

27. පෘථිවියේ ඇති විශාලම සාගරය වන්නේ,

(i) ඉන්දියන් සාගරය යි. (ii) අත්ලාන්තික් සාගරය යි.

(iii) පැසිෆික් සාගරය යි. (iv) දක්ෂිණ සාගරය යි.

28. තැනිතලා නිර්මාණය වීමට බලපාන සාධකය නොවන්නේ,

(i) ග්ලැසියර ය. (ii) සාගර තරංග ය.
(iii) සුළං ය. (iv) සෘතු භේදය ය.

29. දුර දක්නය සොයා ගත්තේ,

(i) ඇල්බට් අයින්ස්ටයින් ය. (ii) ගැලිලියෝ ගැලිලි ය.

(iii) ආකිමිඩීස් ය. (iv) තෝමස් අල්වා එඩිසන් ය.

30. ගුරුත්වාකර්ෂණ බලය සොයා ගත්තේ,

(i) ගැලිලියෝ ගැලිලි ය. (ii) පයිතගරස් ය.

(iii) අයිසෙක් නිව්ටන් ය. (iv) චාලිස් ඩාවින් ය.

» 31 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.

31. භෞතික හා මානව පරිසරය පිළිබඳ නිවැරදිව අවබෝධ කරගත හැකි ප්‍රධාන විෂයයක් වන්නේ ........................... විද්‍යාවයි.

32. කඳුකර භූමියක පිහිටා ඇති උස් සම භූමිය ................................................. නමින් හැඳින්වේ

33. සුදුසු ප්‍රදේශයක ජීවත් වීම "උතුම් කරුණක් ලෙස පෙන්වා දී ඇති බෞද්ධ සූත්‍රය ................................. සූත්‍රයයි.

34. භූගෝල විද්‍යාවේ උප විෂයක් ලෙස ........................................................විෂය සඳහන් කර හැකි ය.

35. හතරවටින් ජලයෙන් වට වී ඇති භූමි ස්කන්ධය ........................................... ලෙස හැඳින්වේ.

36. ලෝකයේ දිගින් වැඩි ම ගංගාව වන්නේ .................................... ගඟ යි.

37. සූර්යයාට ආසන්නම හා කුඩාම ග්‍රහයා ........................................ ග්‍රහයා ලෙස හැඳින්වේ.

38. ග්‍රහයින් තමා වටා කැරකීම භ්‍රමණය ලෙස හැඳින්වෙන අතර සූර්යයා වටා ගමන් කිරීම ........................ ලෙස හැඳින්වේ.

39. සමකයට උතුරින් පිහිටි $66.5^{0}$ අක්ෂාංශ රේඛාව .......................................... වෘත්තය නමින් හැඳින්වේ.

40. පෘථිවියේ ප්‍රධාන දේශාංශ රේඛාව .......................................... දේශාංශ රේඛාව යි.

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

# Primary Piriven Mid Year Tearm Test - 2018

## 03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

භූගෝල විද්‍යාව I, II
Geography I, II

### භූගෝල විද්‍යාව II

සැලකිය යුතුයි :

i. මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

ii. I කොටසෙහි ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ) (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.

iii. II කොටසෙන් ප්‍රශ්න 04ට පිළිතුරු සැපයිය යුතු ය. (මෙම කොටස සඳහා ලකුණු 60ක් හිමි වේ.)

iv. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.

### I කොටස

01.

(අ) කෙටි පිළිතුරු සපයන්න.

i. ශ්‍රී ලංකාවේ වැඩි ම දිස්ත්‍රික්ක සංඛ්‍යාවක් ඇති පළාත කුමක් ද?


ii. පෘථිවියේ සමාන අර්ධ ගෝල දෙකකට බෙදෙන අක්ෂාංශය කුමක් ද?

iii. ලෝකයේ සෘතු භේදයට ඇති වීමට බලපාන ප්‍රධාන හේතුව කුමක් ද?

iv. ලෝකයේ විශාලතම මහාද්වීපය කුමක් ද?

v. ශ්‍රී ලංකාව පිහිටි මහාද්වීප තටකය කුමක් ද?

(ලකුණු 2 X 5 = 10)




(ආ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. A අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය කුමක් ද?

ii. B අක්ෂරයෙන් දැක්වෙන කලපුව කුමක් ද?

iii. C අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?

iv. D අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද?

v. E අක්ෂරයෙන් දැක්වෙන ශේෂ කන්ද කුමක් ද?

(ලකුණු 1 X 5 = 5)

(ඉ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


i. A අක්ෂරයෙන් දැක්වෙන මුහුද කුමක් ද?

ii. B අක්ෂරයෙන් දැක්වෙන සාගරය කුමක් ද?

iii. C අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?

iv. D අක්ෂරයෙන් දැක්වෙන කඳුවැටිය කුමක් ද?

v. E අක්ෂරයෙන් දැක්වෙන තැනිතලාව කුමක් ද? (ලකුණු 1 X 5 = 5)




## II කොටස

02. i. භූගෝල විද්‍යාව පිළිබඳ නිර්වචනයක් ලියන්න.

ii. පරිසරයේ මූලිකාංග දෙකක් සඳහන් කරන්න.

iii. පරිසරයේ සමතුලිත බව බිඳ වැටීමට බලපාන හේතු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

03. i. සාගරයක් යනු කුමක් ද?.

ii. සාගර දෙකක් නම් කරන්න.

iii. මිනිසාගේ පැවැත්මට සාගර උපකාරී වන ආකාරය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

03. i. පෘථිවියේ අජෛව සංරචක මගින් ජෛව සංරචක නිර්මාණය කරයි.

ii. ජෛව සංරචක නිර්මාණයට දායක වන ප්‍රධාන අජෛව සංරචකය කුමක් ද?.

iii. ජෛව සංරචක නිර්මාණයට දායක වන අජෛව සංරචක හතරක් නම් කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

04. i. ඕසෝන් වියනෙහි වැදගත්කම සඳහන් කරන්න.

ii. වායුගෝලයේ ඇති ප්‍රධාන වායු වර්ග තුනක් ඒවායේ ප්‍රතිශතය සමඟ දක්වන්න.

iii. එම වායූන් පැවැත්මට හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

05. i. පෘථිවිය සෞරග්‍රහ මණ්ඩලයේ මධ්‍යයේ පිහිටීම අනුව ප්‍රකට වන සුවිශේෂ ලක්ෂණ පහක් ලියන්න.

ii. කාලයක් පෘථිවියේ සෑම ප්‍රදේශයකටම එක හා සමාන දිවා රාත්‍රි ඇති නොවීමට හේතුවන කරුණු දෙකක් ලියන්න.

iii. පෘථිවියේ ඇති සම්පත් අසීමිත ලෙස මිනිස් පරිභෝජනයට යොදා ගැනීම නිසා ඇතිවන අහිතකර ප්‍රථිඵල පහක් ලියන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

06. i. ඍතුවක් යනු කුමක් ද?.

ii. පරිසරය තුළ සිදු වන ඍතු වෙනස්කම්වලට අනුව සිදු කරන මිනිස් ක්‍රියාකාරකම් පහක් ලියන්න.

iii. ඍතු වෙනස්කම් මිනිසා ජයගත් ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

08. i. ස්වභාවික වෘක්ෂලතා යනු මොනවාද?.

ii. ලෝකයේ ප්‍රධාන වනාන්තර වර්ග දෙකක් සඳහන් කරන්න.

iii. ස්වභාවික වනාන්තර විනාශ වීම වලක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

09. i. විශ්වය පිළිබඳ සඳහන් බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න.

ii. සූර්යයා හා ග්‍රහලෝක හැරුණු විට සෞරග්‍රහ මණ්ඩලයට අයත් ආකාශ වස්තු දෙකක් සඳහන් කරන්න.

iii. සෞරග්‍රහ මණ්ඩලය තුළ පෘථිවියට අද්විතීය ස්ථානයක් හිමිවන්නේ ඇයි ද යන්න, නිදසුන් ඇසුරින් පහදන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019**<br>Primary Piriven Mid Term Test - 2019<br>**ශ්‍රේණිය 03 /**Grade **03**<br>භූගෝල විද්‍යාව I, II — කාලය : පැය තුන යි<br>Geography I, II — Time : Three Hours |

භූගෝල විද්‍යාව I

**උපදෙස්**

- » **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.**
- » **එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**
- » **මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.**

» 1 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

01. බුදුන් වහන්සේ ජලයේ ඇති වටිනාකම උපමා කර ඇත්තේ ..............................................ට ය.
(මව, පියා, පෘථිවිය)

02. පළලින් වැඩි ම ගංගාව .................................... ය.
(නයිල්, ඇමර්සන්, හොවැන්හෝ)

03. බුදුන් වහන්සේ ........................................ වනාන්තර ප්‍රදේශ ආශ්‍රිතව වැඩ හිඳිමින් දේශනා කළ සූත්‍රයකි.
(දම්සක් පැවතුම් සූත්‍රය, රාහුලෝවාද සූත්‍රය, රතන සූත්‍රය)

04. විශ්වයේ ඇති චක්‍රාවාට පිළිබඳ තොරතුරු සඳහන් බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ ................................ සූත්‍රය යි.
(ධාතු විඥාපන, අරුණාවතී, අග්ගඤ්ඤ)

05. සෞරග්‍රහ මණ්ඩලයේ විශාල ම තාරකාව වන්නේ .............................................. ය.
(සූර්යයා, බ්‍රහස්පති, පෘථිවිය)

06. සූර්යයාගේ සිට පොළොවට ඇති දුර කිලෝ මීටර් දස ලක්ෂ ...........................................කි.
(149.6, 155, 146.5)

07. සූර්යයාගේ මතුපිට උෂ්ණත්වය සෙල්සියස් අංශක .................................................. ක් පමණ වේ.
(6000 $^0$C, 6800 $^0$C, 6110 $^0$C)

08. සූර්යග්‍රහ මණ්ඩලය ග්‍රහලෝක ............................... කින් යුක්ත වේ.
(7, 8, 9)

09. නිශ්චිත වශයෙන් ම පූර්ණ චන්ද්‍රයා අහසේ දැකිය හැකි වන්නේ දින ............................ කට වරකි.
(35, 28, 24)

10. සූර්යග්‍රහ මණ්ඩලයේ රැස් වළල්ලක් සහිත විශාලත්වය අනුව දෙවැනි ස්ථානය හිමි ග්‍රහ ලෝකය වන්නේ ..................................ය.
(බ්‍රහස්පති, සෙනසුරු, අඟහරු)

» **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් එක් එක් දී ඇති ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. ශ්‍රී ලංකාවේ ජනාධිකම දිස්ත්‍රික්කය කොළඹ දිස්ත්‍රික්කය යි. (නි/වැ)

12. පෘථිවිය වර්ග කිලෝමීටර් මිලියන 510.1 කින් සමන්විත වේ. (නි/වැ)

13. පෘථිවිය එක් වටයක් භ්‍රමණය වීම සඳහා පැය 24 මිනිත්තු 56, තත්පර 4 ක් ගත වේ. (නි/වැ)

14. අජෛව සංරචක යනු හිරු එළිය, පස, ජලය, වාතය ආදී සාධක වේ. (නි/වැ)

15. පෘථිවියේ ප්‍රාවරණ කලාපය මැග්මා හෙවත් දියරමය පාෂාණවලින් සමන්විත වේ. (නි/වැ)

» **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. එක් පේළියකට හෝ සමූහ වශයෙන් මුදුන් කිහිපයක් සහිත විවිධ උස් මට්ටම් හා බෑවුම්වලින් සමන්විත භූ ලක්ෂණය ................................ ලෙස හැඳින්වේ.

17. හිමාලය වැටිය සහ කුන්ලුන්ෂාන් වැටිය අතර ..................................... සානුව පිහිටා ඇත.

18. ............................................... විල් දහසේ රට ලෙස හඳුන්වයි.

19. ආදර්ශ පෘථිවි ගෝලයේ බටහිර සිට නැගෙනහිර දක්වා හරි මැදින් වැටී ඇති අංශක '0' රේඛාව ............................ ලෙස හැඳින්වේ.

20. සූර්යයාගේ සිට පෘථිවිය කරා එන අහිතකර පාර ජම්බූල කිරණ අවශෝෂණය කරගන්නේ ...................................... ස්ථරය මගිනි.

» **අංක 21 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. භූගෝල විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍රයක් නොවන්නේ,

(01) ජෛව භූගෝල විද්‍යාව යි. (02) සමාජ භූගෝල විද්‍යාව යි.
(03) රසායන විද්‍යාව යි. (04) ආර්ථික භූගෝල විද්‍යාව (........)

22. පිරිවෙන අයත් කුඩා ම පරිපාලන ඒකකය වන්නේ,

(01) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි. (02) දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය යි.
(03) අධ්‍යාපන කලාපය යි. (04) ග්‍රාම නිලධාරී වසම යි. (........)

23. භෞතික පරිසරයට අයත් අංගයක් නොවන්නේ මින් කුමක් ද?

(01) භූමිය (02) වාතය (03) ජලය (04) මහාමාර්ග (........)

24. මිනිසාගේ දැනුම, පළපුරුද්ද, අත්දැකීම් උපයෝගී කරගෙන නිර්මාණය කර ගන්නේ,

(01) සංස්කෘතික පරිසරය යි. (02) භෞතික පරිසරය යි.
(03) දේශගුණික කලාපය යි. (04) භූ විෂමතා කලාපය යි. (........)

25. ශ්‍රී ලංකාවේ පළාත් නවයෙන් විශාල ම පළාත කුමක්ද?

(01) ඌව පළාත (02) බස්නාහිර පළාත

(03) සබරගමු පළාත (04) උතුරුමැද පළාත (........)

26. '' උෂ්ණත්වය අධිකය, ගස්වල කෙත්වතුවල පල හට ගැනීමත්, ධාන්‍ය පැසීමක් සිදු වේ. දිවා කාලය දිගු වන අතර රාත්‍රී කාලය කෙටි ය.

ඉහත පරිසර ලක්ෂණය කුමන ඍතුවකට අයත්වේ ද?

(01) සිසිර ඍතුව (02) වසන්ත ඍතුව

(03) ග්‍රීෂ්ම ඍතුව (04) සරත් ඍතුව (........)

27. ලෝකයේ සිසිර, වසන්ත, ග්‍රීෂ්ම, සරත් ආදී ලෙස පැහැදිලි ඍතු භේදයක් පවතින්නේ,

(01) සමකාසන්න නිවර්තන කලාපය ආශ්‍රිතව ය.

(02) උතුරු හා දකුණු ධ්‍රැව ප්‍රදේශ ආශ්‍රිතව ය.

(03) උතුරු හා දකුණු අක්ෂාංශීය සෞම්‍ය කලාපීය ප්‍රදේශ ආශ්‍රිතව ය.

(04) ආක්ටික් හා ඇන්ටාක්ටික් වෘත්ත ආශ්‍රිතව ය. (........)

28. ඍතුන්ගේ වෙනස්වීම් දක්වන බෞද්ධ දේශනාව කුමක් ද?

(01) මහා මංගල සූත්‍රය (02) නියාම ධර්ම

(03) පරාභව සූත්‍රය (04) චක්කවත්තී සිහනාද සූත්‍රය (........)

29. සත්ත්වයාට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම සඳහා වාතය පිරිසිදුව පැවතිය යුතු බව දේශනා කර ඇත්තේ,

(01) වත්තඛන්ධකයේ ය. (02) කූටදන්ත සූත්‍රයේ ය.

(03) පරාභව සූත්‍රයේ ය. (04) දේවතා සංයුක්තයේ ය. (........)

30. පෘථිවියේ ඇති භූ විෂමතා ලක්ෂණවලින් විශාල ම භූ විෂමතා ලක්ෂණ අයත් පිළිතුර කුමක්ද?

(01) වගුරු බිම්, ගංගා, විල්

(02) අර්ධද්වීප හා දූපත්

(03) මහද්වීප හා සාගර

(04) කඳුවැටි, සානු, තැනිතලා හා නිම්න (........)

31. පෘථිවිගෝලය සමන්විත වන මහද්වීප ගණන,

(01) 2 කි. (02) 4 කි. (03) 5 කි. (04) 7 කි. (........)

32. පෘථිවි තලය මත ඇති විශාල ම මහද්වීපය වන්නේ මින් කුමක් ද?

(01) උතුරු අමරිකා මහද්වීපය (02) දකුණු අමරිකා මහද්වීපය

(03) අප්‍රිකා මහද්වීපය (04) ආසියා මහද්වීපය (........)

33. ලොව ඇති කුඩාම මහද්වීපය මින් කුමක් ද?

(01) යුරෝපා මහද්වීපය

(02) උතුරු අමරිකා මහද්වීපය

(03) ඔස්ට්‍රේලියා මහද්වීපය

(04) ආසියා මහද්වීපය (........)

34. පෘථිවි තලයේ ඇති සාගර ගණන කීයද?

(01) 5 කි. (02) 4 කි.

(03) 6 කි. (04) 7 කි. (........)

35. ලොව ඇති විශාලතම සාගරය වන්නේ,

(01) ආක්ටික් සාගරය යි. (02) ඉන්දියන් සාගරය යි.

(03) පැසිෆික් සාගරය යි. (04) අත්ලාන්තික් සාගරය යි. (........)

36. ලොව කුඩා ම සාගරය වන්නේ මින් කුමක් ද?

(01) ආක්ටික් සාගරය (02) ඉන්දියන් සාගරය

(03) පැසිෆික් සාගරය (04) අත්ලාන්තික් සාගරය (........)

37. බෞද්ධ දර්ශනයට අනුව මුළු සාගර තලයේ සමන්විත වන යොදුන් ගණන කීයද?

(01) 6 , 25 , 000 (02) 4, 80 , 000

(03) 5 , 80 , 000 (04) 6 , 5 , 610 (........)

38. ලොව විශාලත ම දූපත වන්නේ මින් කුමක් ද?

(01) මැඩගස්කරය (02) බෝර්නියෝ

(03) බැෆින් (04) ග්‍රීන්ලන්තය (........)

39. ආසියා මහද්වීපික තටකයට අයත් දූපතක් නොවන්නේ මින් කුමක් ද?

(01) ජාවා (02) සුමාත්‍රා

(03) බෝර්නියෝ (04) ග්‍රින්ලන්තය (........)

40. ග්ලැසියර් මගින් නිර්මාණය වී ඇති තැනිතලාවක් වන්නේ,

(01) පිටාර තැන්න ය. (02) බිහි තැන්න ය.

(03) පැම්පාස් තැන්න ය. (04) වෙරළබඩ තැන්න ය. (........)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019**<br>Primary Piriven Mid Term Test - 2019<br>**03 ශ්‍රේණිය / Grade 03**<br>භූගෝල විද්‍යාව I, II<br>Geography I, II |

## භූගෝල විද්‍යාව II

**සැලකිය යුතුයි :**

i. මෙම ප්‍රශ්න පත්‍රය I,II වශයෙන් කොටස් 2කින් සමන්විතය.
ii. I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ) (ආ) සහ (ඇ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතුය.
iii. II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
iv. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

### I කොටස

(අ) කෙටි පිළිතුරු සපයන්න.

I. ඔබේ පිරිවෙන පිහිටි භූ විෂමතා කලාපය කුමක් ද?

II. ඔබ අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය නම් කරන්න.


III. පෘථිවි ගෝලයේ කර්කටක නිවර්තනය හා මකර නිවර්තනය අතර පිහිටි කලාපය නම් කරන්න.

IV. පෘථිවිය සූර්යයා වටා ගමන් කරන මාර්ගයේ හැඩය කුමක් ද?

V. උත්තර ධ්‍රැවයේ සිට දක්ෂිණ ධ්‍රැවය දක්වා ඇඳ ඇති මනඃකල්පිත රේඛා වර්ගය හඳුන්වන නම කුමක් ද?

(ලකුණු 2X5 =10)

(ආ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.



I. "A" අක්ෂරයෙන් දක්වා ඇති තුඩුව කුමක්ද?


II. "B" අක්ෂරයෙන් දක්වා ඇති දිස්ත්‍රික්කයේ ප්‍රධාන ව්‍යාපාරික වගාව කුමක් ද?

III. "C" අක්ෂරයනේ දක්වා ඇති ස්වාභාවික වරාය කුමක් ද?.

IV. "D" අක්ෂරයෙන් දක්වා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?

V. "E" අක්ෂරයෙන් දක්වා ඇති දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රධාන ඓතිහාසික ස්ථානය කුමක් ද? (ලකුණු1X05)

(ඇ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.




I. "A" මගින් දක්වා ඇති රේඛාව කුමක් ද?

II. "B" අක්ෂරයෙන් දක්වා ඇති අභ්‍යන්තරයේ පිහිටි මුහුද කුමක් ද?

III. "C" මගින් දක්වා ඇති මුහුද කුමක් ද?

IV. "D" මගින් දක්වා ඇති ඇල මාර්ගය කුමක් ද?

V. "E" මගින් දක්වා ඇති ප්‍රධාන කාර්මික රට කුමක් ද? (ලකුණු 1X05)

## II කොටස

02)

I. මිනිසාගේ මූලික අවශ්‍යතා දෙකක් ලියන්න. (ලකුණු 02)

II. පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම සඳහන් සේඛියා ධර්ම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III. නූතන මිනිසා තම මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී පරිසරයට සිදු කරන අහිතකර බලපෑම් මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

03)

I. භූගෝල විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න (ලකුණු 02)

II. භූගෝල විද්‍යාව විෂයයක් ලෙස ඉගෙන ගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

III. භූගෝල විද්‍යාවට අනුව පරිසරය බෙදිය හැකි කොටස් නම් කර ඊට අයත් දෑ වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 05)

04)

I. දේශාංශ 1 ක් භ්‍රමණය වීමට ගතවන කාලය මිනිත්තු 4 ක් නම් උදෑසන 6 සිට දහවල් 12 දක්වා භ්‍රමණය දේශාංශ ගණන කීය ද? ඒ සඳහා ගතවන කාලය කොපමණ ද? (ලකුණු 02)

II. පෘථිවිය වටා නිර්මාණය කර ඇති අක්ෂාංශ හා දේශාංශ රේඛා සහිත මනඃකල්පිත කොටු දැලෙන් ඇති ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

III. පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

05).

I. සාගර පත්ලේ පිහිටි භූ ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. දූපතක් ලෙස කිසියම් රටක් පිහිට යි නම් එවැනි රටකට ඇති වාසි දෙකක් හා අවාසියක් ලියන්න. (ලකුණු 03)

III. අර්ධද්වීපයක් හා දූපතක් අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

06).

I. ලෝකයේ දක්නට ලැබෙන ප්‍රධාන තැනිතලා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. අතීතයේ සිට ම තැනිතලා භූමි මිනිසාට ප්‍රයෝජනවත් වූ ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 03)

III. ශ්‍රී ලංකාව ජනාවාස වීම හා තැනිතලා භූමි අතර පවතින සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 05)

07).

I. ලෝකයේ දක්නට ලැබෙන ස්වාභාවික වෘක්ෂලතා වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. වෘක්ෂලතාවල ස්වභාවය වෙනස්වීමට බලපාන භෞතික සාධක තුනක් දක්වන්න. (ලකුණු 03)

III. 'වනාන්තරවල වැදගත්කම අතීතයට වඩා වර්තමානයේ කතාබහට ලක් වේ.' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு – பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය – 2022**
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
Mid Year Term Test – 2022

පැය තුනයි

(10) භූගෝල විද්‍යාව – I, II    විභාග අංකය : ............................    3 ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව – I

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **එක් එක් ප්‍රශ්නයට දී ඇති උපදෙස්වලට අනුකූලව, සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.**

➢ **අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. පෘථිවියට දේශාංශ එකක් භ්‍රමණය වීමට ගතවන කාලය මිනිත්තු .......................... කි.
(තුන , හතර , පහ)

02. ලෝකයේ පැහැදිලි ඍතු භේදයක් දක්නට ලැබෙන්නේ .......................................... කලාපයේ ය.
(නිවර්තන , සෞම්‍ය , ධ්‍රැව)

03. ලෝකයේ විශාලම දූපත වන්නේ .......................................... යි.
(ග්‍රීන්ලන්තය , අයිස්ලන්තය , මැඩගස්කරය)

04. පෘථිවිය බටහිර සිට ............................................ වේගයෙන් භ්‍රමණය වේ.
(නැගෙනහිරට , ඊශාන දිගට , ගිනිකොන දිගට )

05. බුදු රදුන් "පතිරූප දේස වාසෝච" යනුවෙන් දේශනා කළේ ............................................ සූත්‍ර දේශනාවේ දී ය. (අග්ගඤ්ඤ , මහා මංගල , අරුණාවතී)

06. වායුගෝලයේ තාප හා පීඩන සමතුලිත බව පවත්වා ගැනීමට ........................................ ඉතා වැදගත් වේ. (සුළං හැමීම , ගුරුත්වාකර්ෂණය , අංශක 23 1/2 ක ඇලය)

07. හිමාලය කඳු වැටිය හා කුන්ලුන්ෂාන් කඳු වැටිය අතර ............................................ සානුව පිහිටා ඇත. (ඉරාන , මොන්ගෝලියානු , ටිබෙට්)

08. පෘථිවි ආදර්ශ ගෝලයේ නැගෙනහිර දේශාංශ .......................... රේඛාව ශ්‍රී ලංකාවේ කොළඹ නගරය හරහා වැටී ඇත. ($80^0$ , $79^0$ , $81^0$)

09. පෘථිවි වායු ගෝලයේ වැඩිපුරම ඇත්තේ ........................................ වායුවයි.
(නයිට්‍රජන් , හයිඩ්‍රජන් , ඔක්සිජන්)

10. පෘථිවි ආදර්ශ ගෝලයේ ග්‍රිනිච් මධ්‍යාහ්න රේඛාව .......................................... නගරය හරහා වැටී ඇත. (ග්‍රිනිච් , නිව්යෝක් , ටෝකියෝ)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් එක් එක් දී ඇති ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. සෞරග්‍රහ මණ්ඩලයේ විශාලම ග්‍රහයා වන්නේ බ්‍රහස්පති ය. නි / වැ
12. චක්‍රාවාටයක් හෙවත් මන්දාකිණියක එක් අංශුවක් ලෙස සෞරග්‍රහ මණ්ඩලය හැඳින්වේ. නි / වැ
13. දීප්තිමත් ව දිදුලන අකාශ වස්තු තාරකා වේ. නි / වැ
14. උප ග්‍රහයන් වැඩි ම ග්‍රහලෝකය සෙනසුරු ය. නි / වැ
15. පෘථිවිය මතුපිට සිට කිලෝමීටර් 20-30ත් අතර ඕසෝන් ස්ථරය පිහිටා ඇත. නි / වැ

- **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. පෘථිවිය භ්‍රමණය වීමේ ප්‍රතිඵලයක් ලෙස .............................................. ඇති වේ.
17. භූගෝල විද්‍යාව සඳහා ඉංග්‍රිසි භාෂාවේ භාවිත වන Geography (ජොග්‍රෆි) යන්න .............................................. භාෂාවෙන් බිඳී ආ වචනයකි.
18. පරිසරයේ මූලිකාංග ලෙස වායුගෝලය , ජල ගෝලය, ශිලා ගෝලය සහ .............................................. හඳුනගෙන ඇත.
19. බුදුරජාණන් වහන්සේ .............................................. සූත්‍රයේ විශ්වය ගැන කරුණු පැහැදිලි කර ඇත.
20. චන්ද්‍රයා පෘථිවිය වටා ද, පෘථිවිය සූර්යයා වටා ද, සූර්යයා සෞරග්‍රහ මණ්ඩලය රැගෙන .......................................... කේන්ද්‍රය වටා ද පරිභ්‍රමණය වේ.

- **අංක 21 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

21. ශ්‍රී ලංකාවේ කුඩා ම හා විශාල ම පරිපාලන ඒකකය ඇතුළත් පිළිතුර වන්නේ,
    (i) දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය හා පළාත යි.
    (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය යි.
    (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා පළාත යි.
    (iv) ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය යි. (............)

22. සෞරග්‍රහ මණ්ඩලය සූර්යා ප්‍රධාන කොටගත් ග්‍රහලෝක,
    (i) අටකින් හා තවත් අවකාශ වස්තු රැසකින් සමන්විතය.
    (ii) නවයකින් හා චන්ද්‍රයාගෙන් සමන්විත ය.
    (iii) අටකින් සහ චන්ද්‍රයා හා තාරකාවලින් සමන්විතය.
    (iv) නවයකින් සහ චන්ද්‍රයා හා තාරකාවලින් සමන්විතය. (............)

23. සෞරග්‍රහ මණ්ඩයේ පෘථිවියේ දෙපස පිළිවෙළින් ඇති ග්‍රහලෝක යුගලය වන්නේ,
    (i) සිකුරු සහ අඟහරු ය. (ii) බ්‍රහස්පතී සහ අඟහරු ය.
    (iii) අඟහරු සහ සිකුරු ය. (iv) සිකුරු සහ බ්‍රහස්පති ය. (............)

24. සූර්යා ආලෝකය නිපදවන්නේ අභ්‍යන්තරයේ ඇති,
    (i) හයිඩ්‍රජන් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි.
    (ii) නයිඩ්‍රජන් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි.
    (iii) හීලියම් වායුව හයිඩ්‍රජන් බවට පරිවර්තනය වීමෙනි.
    (iv) කාබන්ඩයොක්සයිඩ් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි. (............)

25. සිකුරු ග්‍රහයා හඳුන්වන වෙනත් නම් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) පහන් තරව හා රතු ග්‍රහයා (ii) පහන් තරුව හා චන්ද්‍රයා
(iii) සිකුරු තරුව හා ඉරබටු තරුව (iv) උදා තරුව හා චන්ද්‍රයා (............)

26. පෘථිවියේ නිවැරදි භ්‍රමණ කාලය වන්නේ,
(i) පැය 23 යි විනාඩි 54 යි. (ii) පැය 23 යි විනාඩි 56 යි.
(iii) පැය 24 යි විනාඩි 55 යි. (iv) පැය 24 යි. (............)

27. පෘථිවියේ සිට සූර්යාට ඇති දුර කිලෝමීටර්,
(i) මිලියන 150 කි. (ii) මිලියන 200 කි.
(iii) මිලියන 100 කි. (iv) මිලියන 125 කි. (............)

28. සෞරග්‍රහ මණ්ඩලයේ පෘථිවියේ සිට ඊළඟට පිළිවෙළින් පිහිටා ඇති ග්‍රහලෝක තුන වන්නේ,
(i) අඟහරු, බ්‍රහස්පතී සහ සෙනසුරු ය. (ii) බ්‍රහස්පතී, අඟහරු, සහ සෙනසුරු ය.
(iii) සෙනසුරු, අඟහරු සහ බ්‍රහස්පතී ය. (iv) සෙනසුරු, බ්‍රහස්පතී සහ අඟහරු ය.(............)

29. 2006 වර්ෂයේ දී වාමන ග්‍රහයෙක් ලෙස නම් කරන්නේ,
(i) සෙනසුරු ග්‍රහයා ය. (ii) බුධ ග්‍රහයා ය.
(iii) යුරේනස් ග්‍රහයා ය. (iv) ප්ලූටෝ ග්‍රහයා ය. (............)

30. සූර්යයාගේ සහ චන්ද්‍රයාගේ ඒකාබද්ධ ගුරුත්වාකර්ෂණය හේතුවෙන් සමුද්‍රයේ,
(i) සුනාමි තරංග ඇතිවේ. (ii) උදම් තරංග ඇති වේ.
(iii) වඩදිය ඇති වේ. (iv) බාදිය ඇති වේ. (............)

31. ඍතුන්ගේ වෙනස්වීම් සඳහන් වන බෞද්ධ දේශනාව වන්නේ,
(i) පරාභව සූත්‍රය (ii) චක්කවත්ති සීහනාද සූත්‍රය
(iii) නියාම ධර්ම (iv) මහාමංගල සූත්‍රය (............)

32. සිතියම් විද්‍යාත්මක කරුණු ඇතුළත් මුල් ම ලෝක සිතියම නිර්මාණය කරන ලද්දේ,
(i) ටොලමි විසිනි. (ii) හෙරඩෝටස් විසිනි.
(iii) ස්ට්‍රොබෝ විසිනි. (iv) ඉරැක්ටොතිනීස් විසිනි. (............)

33. භූගෝල විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍රයක් නොවන්නේ,
(i) ආර්ථික භූගෝල විද්‍යාව (ii) සමාජ භූගෝල විද්‍යාව
(iii) රසායන භූගෝල විද්‍යාව (iv) ජෛව භූගෝල විද්‍යාව (............)

34. උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යයි. ගස්වල දලු හා මල් හටගනී. මුළු පරිසරයම ඉතා අලංකාර වේ. මෙම පාරිසරික ලක්ෂණ දක්නට ලැබෙන ඍතුව වන්නේ,
(i) වසන්ත ඍතුව යි. (ii) සිසිර ඍතුව යි.
(iii) ගිම්හාන ඍතුව යි. (iv) සරත් ඍතුව යි. (............)

35. විශ්වයේ චක්‍රාවාට පිළිබඳ පැහැදිලි කරන බෞද්ධ සූත්‍රය ඇතුළත් පිළිතුර වන්නේ,
(i) ලෝක තතු විඥාපන සූත්‍රය (ii) අග්ගඤ්ඤ සූත්‍රය
(iii) අරුණාවතී සූත්‍රය (iv) කරණීය මෙත්ත සූත්‍රය (............)

36. පෘථිවියේ ඇති භූ විෂමතා ලක්ෂණවලින් විශාලම භූ විෂමතා ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   (i) කඳු වැටි හා සානු (ii) මහද්වීප හා සාගර
   (iii) අර්ධද්වීප හා දූපත් (iv) තැනිතලා හා නිම්න (............)

37. අත්ලන්තික් සාගරය හා මධ්‍යධරණී මුහුද සම්බන්ධ කෙරෙන සමුද්‍ර සන්ධිය මින් කවරක් ද?
   (i) බොස්පරස් (ii) ජිබ්‍රෝල්ටාර්
   (iii) ඩාර් ඩනල්ස් (iv) අප්‍රිකාව (............)

38. ශ්‍රී ලංකාවේ මුහුදු දඹයක් දක්නට ඇති ස්ථානය වන්නේ,
   (i) ත්‍රිකුණාමලය ය. (ii) බේරුවල ය.
   (iii) ආරුගම් බොක්ක ය. (iv) දෙවුන්දර ය. (............)

39. ලෝකයේ විශාලතම සාගරය වන්නේ,
   (i) ඉන්දියන් සාගරය යි. (ii) ආක්ටික් සාගරය යි.
   (iii) පැසිෆික් සාගරය යි. (iv) ඇන්ටාක්ටික් සාගරය යි. (............)

40. පැති තුනකින් සාගර ජලයෙන් වට වී ඇති භූ ස්කන්ධ,
   (i) දූපත් ලෙස හඳුන්වයි. (ii) අර්ධද්වීප ලෙස හඳුන්වයි.
   (iii) මහද්වීප ලෙස හඳුන්වයි. (iv) සාගර ලෙස හඳුන්වයි. (............)

**********

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு – பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍ය වාර පරීක්ෂණය – 2022**
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
Mid Year Term Test – 2022

(10) **භූගෝල විද්‍යාව – I, II** 3 ශ්‍රේණිය

**භූගෝල විද්‍යාව – II**

**සැලකිය යුතුයි :**

❖ **තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. i. පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය කෙටියෙන් පැහැදිලි කරන්න.
   ii. පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය නිසා සිදුවන වෙනස්කම් දෙකක් නම් කරන්න.
   iii. පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය නිසා සිදුවන වෙනස්කම් මානව කටයුතු සඳහා බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 3 + 4 + 5 = 12)

2 i. භූගෝල විද්‍යාව යනු කුමක්ද යි නිර්වචනය කරන්න.
   ii. භූගෝල විද්‍යාවේ උපවිෂය ක්ෂේත්‍ර තුනක් නම් කරන්න.
   iii. භූගෝල විද්‍යාව හැදෑරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන පිළිබඳ විමසන්න.

(ලකුණු 3 + 4 + 5 = 12)

3. i. අක්ෂාංශ හා දේශාංශ යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
   ii. පෘථිවි ආදර්ශ ගෝලයක් ඇඳ, එහි ප්‍රධාන අක්ෂාංශ රේඛා ලකුණු කර නම් කරන්න.
   iii. අක්ෂාංශ හා දේශාංශ රේඛා මිනිසාට ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 3 + 4 + 5 = 12)

4. i. වායුගෝලයේ ස්ථර නම් කරන්න.
   ii. පෘථිවියේ සංයුතිය රූප සටහනකින් නිරූපණය කරන්න.
   iii. ඉහත රූප සටහන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3 + 4 + 5 = 12)

5. i. ශ්‍රී ලංකාවේ පළාත් කීයක් තිබේ ද?
   ii. එම පළාත්වලට අයත් දිස්ත්‍රික්ක වෙන වෙන ම ලියන්න.
   iii. ශ්‍රී ලංකාවේ පරිපාලන ධූරාවලිය රූපසටහනකින් ඇඳ දක්වන්න.

(ලකුණු 3 + 4 + 5 = 12)

6. i. ක්ෂිරපථය හා චක්‍රාවාට යනු කුමක්ද යි හඳුන්වන්න.
   ii. අභ්‍යන්තර හා බාහිර ග්‍රහලෝක රූප සටහනකින් නිරූපණය කරන්න.
   iii. සූර්යයා, ප්‍රධාන කොටගත් සෞරග්‍රහ මණ්ඩලය ඇඳ නම් කරන්න. (ලකුණු 3 + 4 + 5 = 12)

7. i. ප්‍රධාන ඍතු හතර නම් කරන්න.
   ii. ඉන් ඕනෑම ඍතුවක පාරිසරික ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.
   iii. ඍතු භේදය මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 3 + 4 + 5 = 12)

8. i. සූර්යයා හා ග්‍රහලෝක හැරුණු විට සෞරග්‍රහ මණ්ඩලයේ ඇති වෙනත් ආකාශ වස්තු තුනක් නම් කරන්න.
   ii. ඉහත නම් කරන ලද ආකාශ වස්තු පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.
   iii. වඩදිය හා බාදිය ඇති වන ආකාරය දැක්වෙන රූප සටහනක් ඇඳ, කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 3 + 4 + 5 = 12)

*********

සියලුම හිමිකම් ඇවිරිණි]
Kg[g; gjpg;g$upika$ilaJ]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
fy;tp mikr;rfk; - பிரிவேனா கல்விக் gpupt[
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2023
Mz;oWjpg; guPl;ir - 2023
Year End Term Test – 2023

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - I

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **එක් එක් ප්‍රශ්නයට දී ඇති උපදෙස්වලට අනුකූලව, සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.**

---

➢ **ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. මිනිසාගේ දැනුම, පළපුරුද්ද, අත්දැකීම් උපයෝගී කරගෙන ................................................ පරිසරය නිර්මාණය කරගනු ලබයි. (සංස්කෘතික, භෞතික, ස්වභාවික)

02. පෘථිවිය බටහිර සිට ................................................ වේගයෙන් භ්‍රමණය වේ. (නැගෙනහිරට, ඊසානදිගට, ගිනිකොණදිගට)

03. පෘථිවි වායුගෝලයේ ඇති වායු වර්ගවලින් වැඩි ම ප්‍රතිශතයක් අඩංගු වායුව ................................................ වේ. (හයිඩ්‍රජන්, නයිට්‍රජන්, හීලියන්)

04. පෘථිවියේ ප්‍රධාන දේශාංශ රේඛාව ................................................ නගරය හරහා වැටී ඇත. (ග්‍රිනිච්, ලන්ඩන්, ටෝකියෝ)

05. සමකයට උතුරින් පිහිටි අංශක 66 1/2° රේඛාව ................................................ නමින් හැඳින්වේ. (ආක්ටික් වෘත්තය, ඇන්ටාටික් වෘත්තය, සමකය)

06. ලෝකයේ විශාලත ම මිරිදිය විල ................................................ ලෙස නම් කරයි. (සුපීරියන්, ටිටිකාකා, බයිකල්)

07. ගංගා මඟින් නිර්මාණය වන තැනිතලා ප්‍රදේශ ................................................ තැන්න ලෙස හඳුන්වයි. (බිහි, ප්ලාවිත, පිටාර)

08. ................................................ විල් දහසේ රට ලෙස හඳුන්වයි. (අයිස්ලන්තය, ග්‍රීන්ලන්තය, ෆින්ලන්තය)

09. සෞරග්‍රහ මණ්ඩලයේ විශාලත ම ග්‍රහයා වන්නේ ................................................ ය. (සෙනසුරු, බ්‍රහස්පති, සිකුරු)

10. ................................................ සූත්‍රය විශ්වයේ චක්‍රාවාට පිළිබඳ ව පැහැදිලි කරන සූත්‍රයකි. (ලෝක ධාතු විඥාපන, අග්ගඤ්ඤ, අරුණාවතී)

➢ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

11. භූගෝල විද්‍යාව විෂය උප විෂය ක්ෂේත්‍ර ගණනාවකින් යුක්ත වේ. (නි / වැ)
12. පෘථිවි ගෝලයෙන් 97.5% ක් ම ඇත්තේ කරදිය ජලය යි. (නි / වැ)
13. ලෝකයේ ඇති විශාල ම සාගරය ආක්ටික් සාගරය යි. (නි / වැ)
14. ඇමේෂන් ගංගාව ලොව දිගින් වැඩිම ගංගාව වේ. (නි / වැ)
15. සෞරග්‍රහ මණ්ඩලයේ රැස්වළල්ලක් සහිත ග්‍රහලෝකය සෙනසුරු ය. (නි / වැ)

➢ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. භූගෝල විද්‍යාව විෂය භෞතික හා ........................................................ පරිසරය පිළිබඳ ව නිවැරදිව අවබෝධ කර ගත හැකි ප්‍රධාන විෂයකි.
17. සූර්යයාගේ සිට පැමිණෙන පාරජම්බුල කිරණ වළක්වාලන ........................................................ ස්ථරය අපරිවර්ති ගෝලයේ පිහිටා ඇත.
18. කඳුකර ප්‍රදේශයක පිහිටා ඇති තැනිතලා භූමිය ........................................................ නමින් හඳුන්වයි.
19. සෑම පැත්තෙන් ම ජලයෙන් වට වී ඇති භූමි ස්කන්ධයක් ........................................................ ලෙස හඳුන්වයි.
20. දුරදක්නය සොයා ගන්නා ලද්දේ ........................................................ විසින් ය.

➢ **ප්‍රශ්න අංක 21 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ශ්‍රී ලංකාවේ කුඩා ම පරිපාලන ඒකකය වන්නේ,
    (1) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි. (2) ග්‍රාම නිලධාරී වසම යි.
    (3) දිස්ත්‍රික්කය යි. (4) පළාත යි. (..........)
22. ශ්‍රී ලංකාවේ කුඩාම දිස්ත්‍රික්කය වන්නේ,
    (1) කොළඹ යි. (2) කලුතර යි. (3) අනුරාධපුරය යි. (4) ගම්පහ යි. (..........)
23. පෘථිවියේ සංයුතිය ඇතුළත් පිළිතුර වන්නේ,
    (1) වායු ගෝලය, ජල ගෝලය, ශිලා ගෝලය, ජෛව ගෝලය
    (2) වායු ගෝලය, ශිලා ගෝලය, පරිවර්ති ගෝලය, ජෛව ගෝලය
    (3) අපරිවර්ති ගෝලය, මෙසෝ ගෝලය, වායු ගෝලය, ජල ගෝලය
    (4) තාප ගෝලය, වායු ගෝලය, ජල ගෝලය, ශිලා ගෝලය (..........)

24. පෘථිවියේ ව්‍යුහය නිවැරදිව පිළිවෙළට දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ඉහළ ප්‍රාවරණය, ඇතුළත හරය, කබොල

(2) කබොල, ප්‍රාවරණය, හරය

(3) පහළ ප්‍රාවරණය, කබොල, පිටත හරය

(4) ප්‍රාවරණය, පිටත හරය, ඇතුළත හරය (..........)

25. පෘථිවියේ ඉහළින් ම ඇති වායුගෝලීය ස්ථරය කුමක්ද?

(1) මෙසෝ ගෝලය (2) අපරිවර්ති ගෝලය (3) තාප ගෝලය (4) පරිවර්තී ගෝලය (..........)

26. පෘථිවි භ්‍රමණය සඳහා ගතවන කාලය,

(1) පැය 24 කි. (2) පැය 24 මිනිත්තු 56 කි .

(3) පැය 23 මිනිත්තු 56 කි. (4) පැය 23 කි. (..........)

27. වසන්ත ඍතුවේ දී කැපී පෙනෙන පාරිසරික ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යයි. ගස්වල දළු හා මල් හටගනී. මුළු පරිසරය ම ඉතා අලංකාරය.

(2) උෂ්ණත්වය ඉතා ම අඩු ය. දැඩි සීතලක් පවතී. මුළු පරිසරය ම හිමෙන් වැසී යයි.

(3) උෂ්ණත්වය අධික ය. ගස්වල ඵල හට ගැනීමත්, කෙත් වතුවල ධාන්‍ය පැසීමත් සිදු වේ. දිවා කාලය දිගු වේ.

(4) උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු වී යයි. ගස්වල පත්‍ර පතනය වේ. මුළු පරිසරයේ ම වියළි බවක් හට ගනී. (..........)

28. ලෝකයේ වැඩි ම වපසරියක පැතිරී ඇති ගංගාව කුමක්ද?

(1) ඇමේෂන් ගංගාව (2) නයිල් ගංගාව (3) කොංගෝ ගංගාව (4) මිසිසිපි ගංගාව (..........)

29. හිමාලය කඳුවැටිය සහ කුන්ලුන්ෂාන් කඳුවැටිය අතර පිහිටා ඇති සානුව වන්නේ,

(1) ඩෙකෑන් සානුව යි. (2) පාමීර් සානුව යි.

(3) ටිබෙට් සානුව යි. (4) මොන්ගෝලියානු සානුව යි (..........)

30. ලෝකයේ භූ විෂමතා ලක්ෂණවලින් විශාල ම භූ විෂමතා ලක්ෂණ ඇතුළත් පිළිතුර කුමක්ද ?

(1) වගුරුබිම්, ගංගා හා විල් (2) අර්ධද්වීප හා දූපත්

(3) මහද්වීප හා සාගර (4) කඳුවැටි, සානු, තැනිතලා හා නිම්න (..........)

31. ලෝකයේ දක්නට ලැබෙන මහද්වීප හතෙන් විශාලත ම මහද්වීපය වන්නේ,

(1) උතුරු ඇමරිකා මහද්වීපය යි. (2) දකුණු ඇමරිකා මහද්වීපය යි.

(3) අප්‍රිකා මහද්වීපය යි. (4) ආසියා මහද්වීපය යි. (..........)

32. ග්ලැසියර් මගින් නිර්මාණය වන තැනිතලා ප්‍රදේශ හඳුන්වනු ලබන්නේ,

(1) පිටාර තැන්න ලෙස ය. (2) බිහි තැන්න ලෙස ය.

(3) පැම්පාස් තැන්න ලෙස ය. (4) වෙරළබඩ තැන්න ලෙස ය. (..........)

33. ලෝකයේ විශාලත ම දූපත වන්නේ මින් කුමක්ද?

(1) මැඩගස්කරය (2) බෝර්නියෝ (3) ග්‍රීන්ලන්තය (4) ජාවා (..........)

34. හිමාලය, රොකී සහ ඇන්ඩීස් යන කඳු පිහිටා ඇති රටවල් පිළිවෙළින් දැක්වෙන පිළිතුරු වන්නේ,

(1) ඉන්දියාව, උතුරු ඇමරිකාව, දකුණු ඇමරිකාව

(2) ඉන්දියාව, දකුණු ඇමරිකාව, උතුරු ඇමරිකාව

(3) ඉන්දියාව, අප්‍රිකාව, උතුරු ඇමරිකාව

(4) ඉන්දියාව, අප්‍රිකාව, දකුණු ඇමරිකාව (..........)

35. සූර්යයාගේ මතුපිට උෂ්ණත්වය වන්නේ,

(1) 4000 $C^0$ (2) 5000 $C^0$ (3) 6000 $C^0$ (4) 7000 $C^0$ (..........)

36. නිශ්චිත වශයෙන් ම පූර්ණ චන්ද්‍රයා අහසේ දැකිය හැකි වන්නේ,

(1) දින 24 කට වරකි. (2) දින 26 කට වරකි.

(3) දින 28 කට වරකි. (4) දින 30 කට වරකි. (..........)

37. සෞරග්‍රහ මණ්ඩලය සූර්යයා ප්‍රධාන කොටගත් ග්‍රහලෝක,

(1) අටකින් සහ තවත් ආකාශ වස්තු රැසකින් සමන්විත ය.

(2) නවයකින් සහ චන්ද්‍රයාගෙන් සමන්විත ය.

(3) අටකින් සහ චන්ද්‍රයා හා තාරකාවලින් සමන්විත ය.

(4) නවයකින් සහ චන්ද්‍රයා හා තාරකාවලින් සමන්විත ය. (..........)

38. සූර්යයාගෙන් ආලෝකය නිපදවන්නේ එහි අභ්‍යන්තරයේ ඇති,

(1) හයිඩ්‍රජන් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි.

(2) නයිට්‍රජන් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි.

(3) හීලියම් වායුව හයිඩ්‍රජන් බවට පරිවර්තනය වීමෙනි.

(4) කාබන්ඩයොක්සයිඩ් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි. (..........)

39. සිකුරු ග්‍රහයා හඳුන්වන වෙනත් නම් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) පහන් තරුව හා රතු ග්‍රහයා (2) පහන් තරුව හා චන්ද්‍රයා

(3) සිකුරු තරුව හා ඉරබටු තරුව (4) උදා තරුව හා චන්ද්‍රයා (..........)

40. සූර්යයාගේ සහ චන්ද්‍රයාගේ ඒකාබද්ධ ගුරුත්වාකර්ෂණය හේතුවෙන් සමුද්‍රයේ,

(1) සුනාමි තරංග ඇති වේ. (2) උදම් තරංග ඇති වේ.

(3) වඩදිය ඇති වේ. (4) බාදිය ඇති වේ. (..........)

සියලුම හිමිකම් ඇවිරිණි]
Kg[g; gjpg;g$upika$ilaJ]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
fy;tp mikr;rfk; - பிரிவேனா கல்விக் gpupt[
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
Mz;oWjpg; guPl;ir - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - II

**සැලකිය යුතුයි :**
- **තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i) භූගෝල විද්‍යාව යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
ii) පරිසරයේ මූලිකාංග නම් කරන්න.
iii) පරිසරයේ මූලිකාංග අතර පවතින සබඳතාව නිරූපණය වන රූප සටහනක් අඳින්න.
(ලකුණු 3+4+5=12)

02. i) මිනිසාගේ මූලික අවශ්‍යතා තුනක් නම් කරන්න.
ii) අතීතයේ දී මිනිසා මූලික අවශ්‍යතා ඉටුකර ගත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.
iii) නූතන මිනිසා තම මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී පරිසරයට සිදු කරන අහිතකර බලපෑම් මොනවාදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 3+4+5=12)

03. i) භූගෝල විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර තුනක් නම් කරන්න.
ii) භූගෝල විද්‍යාව විෂය හැදෑරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන හතරක් නම් කරන්න.
iii) භෞතික හා සංස්කෘතික පරිසරය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 3+4+5=12)

04. i) ශ්‍රී ලංකාවේ පළාත් කීයද? දිස්ත්‍රික්ක කීයද?
ii) ශ්‍රී ලංකාවේ පරිපාලන ධූරාවලිය රූප සටහනකින් නිරූපණය කරන්න.
iii) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක සිතියමක් ගෙන පළාත් ලකුණු කර නම් කරන්න.
(ලකුණු 3+4+5=12)

05. i) පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
ii) පෘථිවි භ්‍රමණය නිසා සිදුවන බලපෑමක් සහ පරිභ්‍රමණය නිසා සිදුවන බලපෑමක් නම් කරන්න.
iii) ප්‍රධාන අක්ෂාංශ කිහිපයක් සහ දේශාංශ කිහිපයක් යොදා ගනිමින් පෘථිවි ආදර්ශ ගෝලයේ මනඃකල්පිත කොටු දැල නිරූපණය වන රූප සටහනක් අඳින්න.
(ලකුණු 3+4+5=12)

06. i) වායුගෝලයේ ස්ථර නම් කරන්න.

ii) පෘථිවියේ ව්‍යුහය හෙවත් පෘථිවි අභ්‍යන්තර සැකැස්ම නිරූපණය වන රූප සටහනක් අඳින්න.

iii) ජලය අපවිත්‍ර වන මූලාශ්‍ර තුනක් නම් කර එමගින් සිදුවන බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 3+4+5=12)

07. i) මහද්වීප සහ සාගර යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

ii) ලෝකයේ ප්‍රධාන සාගර නම් කරන්න.

iii) ලෝකයේ ප්‍රධාන මහද්වීප නම් කරන්න.

(ලකුණු 3+4+5=12)

08. i) විශ්වය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.


ii) සෞරග්‍රහ මණ්ඩලය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

iii) අපගේ සෞරග්‍රහ මණ්ඩලය රූප සටහනකින් නිරූපණය කරන්න.

(ලකුණු 3+4+5=12)

# භූගෝල විද්‍යාව

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය



|  |  |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018**<br>Primary Piriven Year End Term Test - 2018<br>**03 ශ්‍රේණිය/**Grade **03**<br>භූගෝල විද්‍යාව I, II — කාලය : පැය තුන යි<br>Geography I, II — **Time : Three Hours** |

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## භූගෝල විද්‍යාව I

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. එක් එක් ප්‍රශ්නයට දී ඇති උපදෙස්වලට අනුකූලව, සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

**අංක 01 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවල නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. භූගෝල විද්‍යාඥයාගේ ප්‍රධානතම තොරතුරු ගවේෂණය හා රැස්කර තැබීම සඳහා භාවිත කරන උපකරණය වන්නේ,

i. පුස්තකාලය යි. ii. පරිගණකය යි.
iii. තොරතුරු පොත යි. iv. සිතියම යි.

02. මුල් ම ලෝක සිතියම නිර්මාණය කරන ලද්දේ,

i. ක්ලොඩියස් ටොලමි විසිනි. ii. ස්ට්‍රාබෝ විසිනි.
iii. ටෙෆින් විසිනි. iv. ජී. ඊ. ජෙම්ස් විසිනි.

03. සිතියමක තිබිය යුතු මූලිකාංගයක් **නොවන්නේ**,

i. පරිමාණය යි. ii. දිශාව යි.
iii. විස්තරාත්මක තොරතුරු යි. iv. සූචකය යි.

04. විවිධ සිතියම් වර්ග බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක වන්නේ,

i. ඓතිහාසික සිතියම් හා භූමි පරිභෝග සිතියම් ය. ii. තේමා සිතියම් හා භූ ලක්ෂණ සිතියම් ය.
iii. භෞතික සිතියම් හා සංස්කෘතික සිතියම් ය. iv. පරිපාලන සිතියම් හා ජාල රේඛා සිතියම් ය.

05. ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර,

i. 65654 කි. ii. 65610 කි. iii. 65525 කි. iv. 65710 කි.

06. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

i. ඉන්දියාවට දකුණින් ද අප්‍රිකානු මහද්වීපයට බටහිරින් ද ඔස්ට්‍රේලියාවට දකුණින් ද ගිනිකොන දිග ආසියාවට නැගෙනහිරින් පිහිටා ඇත.

ii. ඉන්දියන් සාගරයේ උතුරින් ද ආසියා මහද්වීපයේ දකුණින් ද ගිනිකොන දිග ආසියාවට බටහිරින් ද පිහිටා ඇත.

iii. ඉන්දියාවට දකුණින් ද ඕස්ට්‍රේලියාවට උතුරින් ද අප්‍රිකාවට නැගෙනහිරින් ද ගිනිකොන දිග ආසියාවට බටහිරින් ද පිහිටා ඇත.

iv. ශ්‍රී ලංකාවට උතුරින් ඉන්දියාව ද දකුණින් ඕස්ට්‍රේලියාව ද නැගෙනහිරින් අප්‍රිකාව ද බටහිරින් ඉන්දුනීසියාව ද පිහිටා ඇත.

07. ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම දැක්වෙන පිළිතුර කුමක් ද?

i. උතුරු අක්ෂාංශ 5ත් 10ත් - නැගෙනහිර දේශාංශ 79 - 82 අතර

ii. උතුරු අක්ෂාංශ 6ත් 9ත් - නැගෙනහිර දේශාංශ 79 - 82 අතර

iii. උතුරු අක්ෂාංශ 5ත් 10ත් - නැගෙනහිර දේශාංශ 75 - 85 අතර

iv. උතුරු අක්ෂාංශ 5ත් 10ත් - නැගෙනහිර දේශාංශ 79 - 89 අතර

08. ශ්‍රී ලංකාව තැප්‍රොබේන් ලෙස නම් කර ඇත්තේ කවුරුන් විසින් ද?

i. ෆර්ඩිනන්ට් ටෝනිස් ii. ස්ට්‍රාබෝ iii. ක්ලෝඩියස් ටොලමි iv. ජේ.ඊ.ජෙම්ස්

09. ශ්‍රී ලංකාවේ දේශගුණය තීරණය වීමට බලපා ඇති සාධකයක් **නොවන්නේ** මින් කුමක් ද?

i. මෝසම් සුළංවල බලපෑමෙන් වර්ෂාව ඇතිවීම.

ii. ඉන්දියානු උප මහද්වීපයේ සිට හමා එන වියළි සුළං නිසා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්වය ඉහළ යාම.

iii. කුඩා දූපතක් වීම නිසා ඉන්දියන් සාගරයේ සිට හමා එන සුළං නිසා උෂ්ණත්වය සමනය වීම.

iv. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරයේ පිහිටි ජලාශ.

10. භූ විද්‍යාඥයින් විසින් පිළිගන්නා ආකාරයට ශ්‍රී ලංකා භූමිය නිර්මාණය වී ඇත්තේ කුමන යුගයේ දී ද?

i. ප්‍රාග් කේම්බ්‍රීය යුගය ii. ප්ලෙයිස්ටොසීන යුගය iii. මයෝසීන යුගය iv. ඔලිගොසින යුගය

11. වෙරළබඩ පිහිටි භූ ලක්ෂණයක් **නොවන්නේ** මින් කුමක් ද?

i. කලපු ii. සානු iii. බොකු iv. තුඩු

12. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කරනු ලබන ප්‍රධාන වගාවක් වන්නේ මින් කුමක් ද?

i. පොල් වගාව ii. තේ වගාව iii. කුරුඳු වගාව iv. කොකෝවා වගාව

13. ලවන ජලයෙන් යුක්ත කුඩා ජල ප්‍රදේශය හඳුන්වන නම කුමක් ද?

i. විල ii. මුහුද iii. දූපත iv. සාගරය

14. ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණවලින් වැඩි කොටසක් අයත් වන කලාපය කුමක් ද?

i. මධ්‍ය කඳුකරය ii. සබරගමු කඳු ප්‍රදේශය

iii. වෙරළ බඩ තැනිතලාව iv. අභ්‍යන්තර තැනිතලාව

15. පස නිර්මාණය සඳහා බලපාන සාධකයක් **නොවන්නේ** මින් කුමක් ද?

i. මව් පාෂාණ ii. දේශගුණය

iii. සංස්කෘතිය iv. ස්වාභාවික වෘක්ෂලතා

**16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු හතරෙන් එකක් කුමන හෝ හේතුවක් මත අනෙක් පිළිතුරු තුන හා නොගැලපේ එම නොගැලපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

16. i. පෘථිවිය ii. බුධ iii. සිකුරු iv. චන්ද්‍රයා

17. i. නැමි කඳු ii. ශේෂ කඳු iii. අයිස් කඳු iv. කුට්ටි කඳු

18. i. ආසියා මහාද්වීපය ii. අප්‍රිකා මහාද්වීපය iii. යුරෝපා මහාද්වීපය iv. ඉන්දීය සාගරය

19. i. පරිවර්ති ගෝලය ii. අපරිවර්ති ගෝලය iii. ජල ගෝලය iv. මෙසෝ ගෝලය

20. i. මහවැලි ගඟ ii. කැලණි ගඟ iii. නිල්වලා ගඟ iv. මල්වතු ඔය

**21 සිට 25 දක්වා දී ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුර දී ඇති වරණ තුනෙන් තෝරා හිස්තැනෙහි ලියන්න.**

21. ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා ගිනිකොණ දිග පහත් බිම්වල ..........................................ට අයත් පාෂාණ පිහිටා ඇත.

i. උස්බිම් ශ්‍රේණිය ii. වන්නි ශ්‍රේණිය iii. විජයානු ශ්‍රේණිය

22. පුත්තලමේ සිට මුලතිව් දක්වා පිහිටි කලාපයේ පිහිටා ඇත්තේ ................................................ ය.

i. මයෝසීන පාෂාණ ii. ජුරාසික් පාෂාණ iii. පෙග්මටයිට් පාෂාණ

23. පස නිර්මාණය වීමට බලපාන ප්‍රධාන සාධකය ලෙස .................................................. හැඳින්විය හැකිය.

i. ජුරාසික් පාෂාණ ii. ග්‍රැනයිට් පාෂාණ iii. මව් පාෂාණ

24. පසෙහි ඇති ශාක හා සත්ත්ව මල ද්‍රව්‍යය වේගයෙන් දිරාපත් වීම කෙරෙහි .......................................... හේතුවේ.

i. මිනිස් ක්‍රියාකාරකම් ii. පාංශු ජීවීන්ගේ ක්‍රියා iii. කාලය මගින් ඇති වන විවිධ ක්‍රියා

25. කතරගම කන්ද, මිහින්තලේ කන්ද අයත් වන්නේ .................................................... භූ විෂමතා කලාපයට යි.

i. වෙරළබඩ ii. අභ්‍යන්තර iii. මධ්‍ය කඳුකරය.

**26 සිට 30 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදිනම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

26. පස නිර්මාණයට භූ විෂමතාව දැඩි සේ බලපායි. නි/වැ

27. ප්‍රධාන වශයෙන් පසට හියුමස් එකතු වන්නේ ස්වාභාවික වෘක්ෂලතා මගිනි. නි/වැ

28. වෙරළ භූ විෂමතා ලක්ෂණ විශාල ප්‍රමාණයක් පිහිටා ඇත්තේ අභ්‍යන්තර තැනිතලාවේ ය. නි/වැ

29. සාගරයේ සිට බලන විට ගොඩබිම දෙසට අර්ධ කවාකාරව නෙරාගිය කරදිය පිරුණු මුහුද ප්‍රදේශ බොක්ක නම් වේ. නි/වැ

30. රිටිගල කන්ද මධ්‍ය කඳුකරයට අයත් වේ. නි/වැ

**31 සිට 35 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා I කොටසේ අනුපිළිවෙළට II කොටස ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරා ලකුණු කරන්න.**

31. කපොල්ල පිහිටි ස්ථානයට අදාළ මාර්ගය නිවැරදි ව දැක්වූ විට නිවැරදි වන්නේ,

| I | II |
|---|---|
| 01. ගලගෙදර | A මාතලේ - මහනුවර |
| 02. බලන | B අවිස්සාවේල්ල - නුවරඑළිය |
| 03. ගිනිගත්හේන | C කුරුණෑගල - මහනුවර |
| 04. බලකඩුව | D කොළඹ - මහනුවර |

i. C,D,A,B ii. A,B,C,D iii. D,C,A,B iv. B,A,D,C

32. වෙරළබඩ තැනිතලාවේ භූ විෂමතා ලක්ෂණ පිහිටි ස්ථාන නිවැරදි ව යා කළ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| I | II |
|---|---|
| 01. බොක්ක | A ඟවුල් - කුදිරමලේ |
| 02. කලපුව | B හම්බන්තොට - පුත්තලම |
| 03. තුඩුව | C ආරුගම් - වැලිගම |
| 04. ලේවාය | D නන්දිකඩාල් - මූන්දල |

i. C,D,A,B ii. A,B,C,D iii. D,C,A,B iv. B,A,D,C

33. එක් එක් ඍතුවට අදාළ ව දැකිය හැකි පරිසර වෙනස්කම් නිවැරදි ව ගැළපූ විට පිළිතුර තෝරන්න.

| I | II |
|---|---|
| 01. ශිත ඍතුව | A උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු වී යයි. ගස්වල පත්‍ර පතනය වීම සිදු වේ. මුළු පරිසරය ම වියළි බවක් පෙන්වයි. |
| 02. වසන්ත ඍතුව | B උෂ්ණත්වය ඉතාම අඩුය දැඩි සීතලයක් පවතී. මුළු පරිසරය ම හිමෙන් වැසී යයි. |
| 03. ගිම්හාන | C උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යයි. ගස්වල දළු හා මල් හට ගනී. පරිසරය ඉතා අලංකාරය. |
| 04. සරත් ඍතුව | D උෂ්ණත්වය අධිකය. ගස්වල ඵල හට ගැනීමත් ධාන්‍ය පැහීමත් සිදු වේ. දිවා කාලය දිගු වේ. රාත්‍රිය කෙටි ය. |

i. D,C,B,A ii. B,C,D,A iii. B,D,A,C iv. A,B,C,D

34. දී ඇති දූපත අයත් සාගරය නිවැරදි ව යා කළ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| I | II |
|---|---|
| 01. ග්‍රීන්ලන්තය | A ඉන්දියන් සාගරය |
| 02. ජපන් දූපත් | B උතුරු අත්ලාන්තික් සාගරය |
| 03. නිව්ගිනියා | C වයඹ දිග පැසිෆික් සාගරය |
| 04. මැඩගස්කරය | D නිරිත දිග පැසිෆික් සාගරය |


i. A,B,C,D ii. B,C,D,A iii. A,C,B,D iv. D,B,C,A

35. I හි දැක්වෙන භූ විෂමතා ලක්ෂණයට අදාළ නිදසුන් නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| I | II |
|---|---|
| 01. නැමි කඳු | A ඉන්දියාවේ හින්දුස්ථාන් / ඕස්ට්‍රේලියාවේ නල්ලබාර් |
| 02. කුට්ටි කඳු | B ඇමරිකා එක්සත් ජනපදයේ මොනැඩ් නොක්ස් / ලංකාවේ රිටිගල |
| 03. ශේෂ කඳු | C හිමාලය/ ඇල්ප්ස් / රොකි/ අන්දිස් |
| 04. තැනිතලා | D ප්‍රංශයේ වොස්ජීස්/ ජර්මනියේ බ්ලැක් ෆොරස්ට් |

i. B,A,D,C    ii. C,D,B,A    iii. A,C,B,D    iv. A,B,C,D

අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට ඉහත 1:50000 භූ ලක්ෂණ සිතියම උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.




36. සිතියමේ A අක්ෂරයෙන් දක්වා ඇති භූ ලක්ෂණය,

i. කපොල්ලකි.    ii. නෙරුවකි.

iii. නිම්නයකි.    iv. දළ බෑවුමකි.

37. සිතියමේ B අක්ෂරයෙන් දක්වා ඇත්තේ,

i. දූණුවිලකි    ii. සානුවකි

iii. ඩෙල්ටාවකි    iv. වගුරු බිමකි

38. C ආකාරයෙන් දක්වා ඇත්තේ,

i. කඳු මුදුනකි
ii. හැඩපළු ලක්ෂණයකි
iii. ජලය පිරුණු තැනකි
iv. වනාන්තරයකි

39. D අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?

i. සිතියමේ දිශාව
ii. සිතියමේ උස
iii. සිතියමේ ඉහළ ප්‍රදේශය
iv. සිතියම හැරවිය යුතු දිශා

40. E අක්ෂරයෙන් දක්වා ඇත්තේ,

i. කඳු වැටියකි
ii. ජලය පිහිටි ප්‍රදේශයකි
iii. කොත් කන්දකි
iv. සානුවකි

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Term Test - 2018

### 03 ශ්‍රේණිය / Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

භූගෝල විද්‍යාව I, II
Geography I, II

භූගෝල විද්‍යාව II

සැලකිය යුතුයි :

i. මෙම ප්‍රශ්න පත්‍රය I,II වශයෙන් කොටස් 2කින් සමන්විතය.
ii. I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (A) (B) (C) සහ (D) කොටස් හතරට ම පිළිතුරු සැපයිය යුතු ය.
iii. II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
iv. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

I කොටස

01)

i. සෞරග්‍රහ මණ්ඩලයේ ඇති වාමන ග්‍රහලෝක දෙකක් නම් කරන්න.

ii. ශ්‍රී ලංකාවේ පිහිටීම සංස්කෘතියට බලපා ඇති ආකාරය පිළිබඳ ව උදාහරණ දෙකක් දක්වන්න.

iii. සංයුක්ත නිකායේ දේවතා සංයුක්ත වන රෝපණ සූත්‍රයේ වෘක්ෂයක ඇති ගුණය දක්වන්නේ කෙසේ ද?

iv. පෘථිවියේ තුලිතතාව එනම් ජීවීන්ට හිතකර තත්ත්වයක් පවත්වා ගැනීමට වායුගෝලය මගින් ඉටු කරන කාර්යයන් දෙකක් දක්වන්න.

v. ගංගාවක් යනු කුමක් ද හඳුන්වන්න.

(ලකුණු 2X5 =10)

(අ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.

I. "A" අක්ෂරයෙන් දක්වා ඇති තුඩුව නම් කරන්න.

II. "B" අක්ෂරයෙන් දක්වා ඇති කලපුව නම් කරන්න.

III. "C" අක්ෂරයෙන් දක්වා ඇති දූපත නම් කරන්න.

IV. "D" අක්ෂරයෙන් දක්වා ඇති කලපුව නම් කරන්න.

V. "E" අක්ෂරයෙන් දක්වා ඇති බොක්ක නම් කරන්න. (ලකුණු 1X05)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.

I. "A" අක්ෂරයෙන් දක්වා ඇති සාගරය කුමක් ද?

II. "B" අක්ෂරයෙන් දක්වා ඇති මුහුද කුමක් ද?

III. "C" අක්ෂරයෙන් දක්වා ඇති ඇල මාර්ගය කුමක් ද?

IV. "D" අක්ෂරයෙන් දක්වා ඇති මුහුද කුමක් ද?

V. "E" අක්ෂරයෙන් දක්වා ඇති දූපත කුමක් ද? (ලකුණු 1X05)

## B කොටස

02)

i. භූගෝල විද්‍යාව පිළිබඳ කෙටි නිර්වචනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

ii. ජෛව ගෝලය සමන්විත වන ප්‍රධාන සංරචක දෙක නම් කරන්න. (ලකුණු 03)

iii. ඉහත දක්වන ලද එක් සංරචකයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

03)

i. පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය වෙන වෙන ම හඳුන්වන්න. (ලකුණු 02)

ii. පෘථිවියේ භ්‍රමණය නිසා සිදුවන පාරිසරික වෙනස්කම් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. ප්‍රධාන ඍතු හතර නම් කර එක් එක් ඍතුවක දී දැකිය හැකි පාරිසරික වෙනස්කම බැගින් ලියන්න. (ලකුණු 05)

04)

i. පෘථිවිය සෞරග්‍රහ මණ්ඩලයේ පිහිටි ස්ථානය නිසා ඇති වී ඇති සුවිශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. පෘථිවිය අංශක $23\frac{1}{2}^0$ ඇලව පිහිටීම නිසා ඇති වන ප්‍රතිඵලය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

iii. පෘථිවි ව්‍යුහය සමන්විත වන ප්‍රධාන කොටස් තුන නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

05).

i. ලොව විශාලතම සාගරය කුමක් ද? (ලකුණු 02)

ii. දූපතක් ලෙස පිහිටීම මගින් රටකට අත්වන වාසි දෙකක් හා අවාසියක් ලියන්න. (ලකුණු 03)

iii. අර්ධද්වීප හා දූපත අතර පවතින වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

06).

i. ස්වභාවික වෘක්ෂලතා යනු මොනවාද හඳුන්වන්න. (ලකුණු 02)

ii. ප්‍රධාන වනාන්තර වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

iii. ඉහත දැක් වූ වනාන්තරවලින් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

07).

i. වැඩි ම උප ග්‍රහයන් සංඛ්‍යාවක් ඇති ග්‍රහලෝකය හා අඩු ම උප ග්‍රහයන් සංඛ්‍යාවක් ඇති ග්‍රහ ලෝකය නම් කරන්න. (ලකුණු 02)

ii. ක්ෂීර පථය හා චක්‍රාවාටය වෙන වෙන ම හඳුන්වන්න. (ලකුණු 03)

iii. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට බලපාන හේතු 03ක් ලියා ඉන් එකක් ජෛවගෝලයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

08).

i. විශ්වය යනු කුමක් ද? (ලකුණු 02)

ii. විශ්වය නිර්මාණය වීම පිළිබඳ දැක්වෙන බුද්ධ දේශනාවේ සූත්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. ඔබ නම් කළ එක් සූත්‍රයක විශ්වය නිර්මාණය වීම පිළිබඳ දැක්වෙන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

09).


i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාෂාණ කලාප තුනකි. ඉන් 02ක් නම් කරන්න. (ලකුණු 02)

ii. පස නිර්මාණයට බලපාන සාධක 03ක් ලියන්න. (ලකුණු 03)

iii. පස මිනිසාට වැදගත් වන ආකාර 03ක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

01).

(අ)



(ဈ)



# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Term Test - 2019

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ශ්‍රේණිය 03 /Grade 03**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව I, II | කාලය : පැය තුන යි |
| Geography I, II | Time : Three Hours |

### භූගෝල විද්‍යාව I

සැලකිය යුතුයි :

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එක් එක් ප්‍රශ්නයට දී ඇති උපදෙස්වලට අනුකූලව, සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

» 1 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

01. භූ ලක්ෂණ සිතියම් යනු ......................... ඇතුළත් වන සේ සකස් කරන ලද සිතියමය. (පර්යන්ත තොරතුරු, මුහුණත තොරතුරු, භෞතික හා සංස්කෘතික ලක්ෂණ, භූ විෂමතා හා ජල වහන රටා)

02. මධ්‍යම කඳුකරයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණයකි ............................. (දුණුවිල්, ගං දගරය, වැලිපර, තෙරුව)

03. සිතියම් විද්‍යාත්මක කරුණු ඇතුළත් මුල් ම ලෝක සිතියම නිර්මාණය කරන ලද්දේ ......................... විසිනි. (ටොලමි, ස්ට්‍රාබෝ, හෙරඩෝටස්, ඉරැක්ටොතිනිස්)

04. උස් කඳු දෙකක් අතර පිහිටි පටු නිම්නය ......................... ලෙස හඳුන්වයි. (සානුව, ගංගාව, කපොල්ල, කඳුවැටිය)

05. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳු කරයේ පිහිටි කඳු වැටියක් ලෙස ......................... වැටිය හැඳින්විය හැකි ය. (රිටිගල, ගල්ඔය, රාගල, බතලේගල)

06. සාගරය සමග සෘජුව සම්බන්ධ නොවන රට ඇතුළත පිහිටා ඇති කරදිය පිරුණු ජලාශ ......................... නමින් හැඳින් වේ. (ලේවාය, ඩෙල්ටා, කලපු, බොක්ක)

07. වැලි පරයක් හේතුවෙන් මුහුදෙන් වෙන් වුවද පටු මොයක් මගින් කරදිය ගලා එන නොගැඹුරු ජලාශ ......................... ලෙස හැඳින් වේ. (ලේවාය, කලපු, බොක්ක, තුඩුව)

08. තබ්බෝව, ආඬිගම පල්ලම යන ප්‍රදේශයන්හි ......................... යුගයට අයත් පාෂාණ දක්නට ලැබේ. (මයෝසීන, ජුරාසික, ආකීය, තෘතියික)

09. මුහුදු මට්ටමේ සිට මීටර ......................... ක් වූ උසකින් පිදුරුතලාගල කන්ද පිහිටා ඇත. (2524, 2357, 2429, 2624)

10. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ ......................... වර්ෂාව මගිනි. (ඊසාන දිග, නිරිත දිග, වාසුළි, සංවහන)

» ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් එක් එක් දී ඇති ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.

11. මව් පාෂාණ දිරාපත් වීමෙන් පසට ඛනිජ පදාර්ථ ලැබේ (නි/වැ)

12. ශ්‍රී ලංකාව ලෝකයේ පැරණිතම භූ ස්කන්ධයකි (නි/වැ)

13. ඉන්දියානු උප මහාද්වීපයේ සිට හමා එන වියළි සුළං හේතුවෙන් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්ව ඉහළ යයි (නි/වැ)

14. රටක සාපේක්ෂ පිහිටීම විස්තර කරන්නේ එම රට පිහිටි අක්ෂාංශ හා දේශාංශ අනුවයි (නි/වැ)

15. 1609 දී ගැලීලියෝ ගැලිලි දුරදක්නය සොයා ගැනීමෙන් අභ්‍යවකාශ ගවේෂණය වේගවත් විය (නි/වැ)

» අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

16. සූර්යයාට කිට්ටු ම ග්‍රහලෝකය ........................... ග්‍රහයා වේ.

17. සූර්යයාගේ හා චන්ද්‍රයාගේ ඒකාබද්ධ ගුරුත්වාකර්ෂණය හේතුවෙන් සමුද්‍රයේ ........................... තරංග ඇති වේ.

18. බුද්ධ දේශනාවේ සූත්‍ර පිටකයේ සූත්‍ර ........................... හි විවිධ කරුණු අරභයා ලෝක විෂය ගැන දේශනා කර තිබේ.

19. කේතුධර වනාන්තර හෙවත් ........................... වනාන්තර උතුරු ඇමරිකාවේ පිහිටා ඇත.

20. මැයි සිට සැප්තැම්බර් දක්වා ශ්‍රී ලංකාවේ තෙත් කලාපය දෙසට හමා එන සුළං ........................... නමින් හැඳින්වේ.

» අංක 21 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. විලක් නිර්මාණය වීමට බලපාන සාධක පමණක් ඇතුළත් පිළිතුරු කුමක් ද?

(i) අවපාත , සුවිභේද , ග්ලැසියර , යමගල්

(ii) අවපාත , යමගල් ,අයිස්කඳු , වගුරු බිම

(iii) යමගල් , අයිස්කඳු , අවහන , නායයෑම්

(iv) යමගල් , අයිස්කඳු , අවපාත , ග්ලැසියර

(........)

22. තැනිතලාවක් නිර්මාණය වීමට දායක වන සාධක පමණක් ඇතුළත් පිළිතුරු වන්නේ

(i) යමගල් , අයිස්කඳු , අවපාත , නායයෑම්

(ii) ග්ලැසියර , සාගර තරංග , සුළං , ගංගා

(iii) ග්ලැසියර , සුළං , අයිස්කඳු , නායයෑම්

(iv) ගංගා , නායයෑම් , අයිස්කඳු , නායයෑම්

(........)

23. උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු වී යයි. ගස්වල පත්‍ර පතනය වීම සිදුවේ. මුළු පරිසරයම වියළි බවක් පෙන්වයි. මෙම ලක්ෂණ ඇතිවන සෘතුව කුමක් ?

(i) සරත් (ii) ගිම්හාන

(iii) වසන්ත (iv) සිසිර

(........)

24. ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ කුමන ස්ථර දෙක අතර ද?

(i) තාප ගෝලය හා මේසෝ ගෝලයය. (ii) අපරිවර්ති ගෝලය හා පරිවර්ති ගෝලය.

(iii) පරිවර්ති ගෝලය හ මෙසෝ ගෝලය. (iv) පරිවර්ති ගෝලය හා තාප ගෝලය. (........)

25. පෘථිවිය එක් වටයක් භ්‍රමණය වීමට ගතවන නිවැරදිම වේලාව වන්නේ

(i) පැය 24 කි. (ii) පැය 23 මිනිත්තු 56 තත්පර 4 කි.

(iii) පැය 23 මිනිත්තු 54 තත්පර 6 කි. (iv) පැය 24 මිනිතතු 56 තත්පර 6 කි. (........)

26. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයේ විශාලතම දිස්ත්‍රික්කය වන්නේ,

(i) කොළඹ යි. (ii) මොණරාගල යි.

(iii) අනුරාධපුරය යි. (iv) මාතර යි. (........)

27. පෘථිවිය වටා වායුගෝලය පැවතීමෙන්,

(i) ගෝලීය උෂ්ණත්වය තුලිතව පවතියි.

(ii) දහවලෙහි දරා ගත නොහැකි උණුසුමක් ඇති වේ.

(iii) රාත්‍රිව අධික ශීතලක් ඇති වේ.

(iv) ඉහත සියල්ල ම සිදු වේ. (........)

28. ඕස්ට්‍රේලියා මහාද්වීප තටකයට අයත් දූපත් ඇතුළත් පිළිතුර කුමක්ද?

(i) ටැස්මේනියා, පැපුවා , නිව්ගිනියා

(ii) මැඩගස්කරය , පැපුවා , නිව්ගිනියා

(iii) බහමාස් , පැපුවා , නිව්ගිනියා

(iv) ටැස්මේනියා , මැඩගස්කරය (........)

29. ලොව විශාල ම සාගරය වන්නේ,

(i) ආක්ටික් සාගරය යි. (ii) පැසිෆික් සාගරය යි.

(iii) අත්ලාන්තික් සාගරය යි. (iv) දක්ෂිණ සාගරය යි. (........)

30. කිසියම් වේලාවක දී පවතින උෂ්ණත්වයක් යටතේ වායු කැටියක තිබෙන ජල වාෂ්ප ප්‍රමාණය හඳුන්වන්නේ

(i) සාපේක්ෂ ආර්ද්‍රතාව (ii) නිරපේක්ෂ ආර්ද්‍රතාව

(iii) වායුගෝලීය පතනමානය (iv) වායුගෝලීය ආර්ද්‍රතාව (........)

31. ග්ලැසියර මගින් නිර්මාණය වී ඇති තැන්නකට උදාහරණයකි

(i) පිටාර තැන්න (ii) බිහි තැන්න

(iii) පැම්පාස් තැන්න (iv) දියළු තැන්න (........)

32. අවපාත මගින් නිර්මාණය වී ඇති විලකට උදාහරණයක් වන්නේ,

(i) ටිටිකාකා විල ය. (ii) ටැංගනිකා විල ය.

(iii) වින්ඩමියර් විල ය. (iv) ක්‍රේට විල ය.

(........)

33. බුදුරජාණන් වහන්සේ වනාන්තර ආශ්‍රිතව වැඩ හිඳිමින් දේශනා කළ සූත්‍රයක් නොවන්නේ මින් කුමක් ද?

(i) දමසක් පැවතුම් සූත්‍රය. (ii) මහා සීහනාද සූත්‍රය.

(iii) අම්බට්ඨ තේවිජ්ජ සූත්‍රය. (iv) ආලවක සූත්‍රය.

(........)


34. අවුරුදු 76කට වරක් සූර්යයා වටා වූ කක්ෂයේ ගමන් ගන්නා වල්ගා තරුව වන්නේ

(i) ඉර බටු තරුව යි. (ii) හැලීගේ වල්ගා තරුව යි.

(iii) උදතරුව යි. (iv) ඔරායන් ය.

(........)

35 සිට 37 ප්‍රශ්නවලට පහත ලංකා සිතියම උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න



. සිතියමේ A අකෂරයෙන් දක්වා ඇත්තෙ,

(i) කලපුවකි.
(ii) බොක්කකි.
(iii) වැලිපරයකි.
(iv) තුඩුවකි. (........)

36. සිතියමේ B අක්ෂරයෙන් දක්වා ඇති භූ ලක්ෂණය වන්නේ,

(i) තුඩුවකි.
(ii) කලපුවකි.
(iii) ගල් පර්වතයකි.
(iv) වැලිපරයකි . (........)

37. C අක්ෂරයෙන් දක්වා ඇති වෙරළ බඩ ලක්ෂණය වන්නේ,

(i) කලපුවකි.
ii) බොක්කකි.
(iii) වරායකි.
(iv) වැලිපරයකි. (........)

38 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවල ප්‍රකාශ දෙක බැගින් ඇතුලත් වේ

| පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | පිළිතුර |
|---|---|---|
| 38 පෘථිවිය සූර්යයා වටේ භ්‍රමණය වේ. | චන්ද්‍රයා පෘථිවිය වටා භ්‍රමණය වේ. | ............ |
| 39 ලෝකයේ විශාලම දූපත ග්‍රීන්ලන්තයයි. | ග්‍රීන්ලන්තයේ ගිනිකඳු වැඩි ගණනක් පිහිටා ඇත. | ............ |
| 40 හොර්ටන්තැන්න මධ්‍ය කඳුකරයේ පිහිටි සානුවකි. | ගල්ඔය කඳුවැටිය මධ්‍ය කඳුකරයට අයත් වේ. | ............ |

ඉහත දී ඇති ප්‍රකාශ හොඳින් කියවා බලා පහත වගුවෙහි දක්වෙන ප්‍රකාශවලින් වඩාත් ගැළපෙන ප්‍රකාශයට අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න

| අංකය | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | 1 නිවැරදිය | නිවැරදි |
| 2 | 2 නිවැරදිය | වැරදි |
| 3 | 3 වැරදි | වැරදි |
| 4 | 4 වැරදි | නිවැරදි |

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Term Test - 2019

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

භූගෝල විද්‍යාව I, II
**Geography** I, II

භූගෝල විද්‍යාව II

සැලකිය යුතුයි :

මෙම ප්‍රශ්න පත්‍රය I, II ලෙස කොටස් දෙකකින් යුක්ත ය. I කොටසේ ප්‍රශ්න සියල්ලටමත් II කොටස 4කට පිළිතුරු සපයන්න.

I කොටස

01.(අ) පහත දක්වා ඇති ශ්‍රී ලංකා සිතියම උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න


i "A" වලින් දක්වා ඇති භූ විෂමතා කලාපය කුමක් ද? මෙම ප්‍රදේශයෙන් ආරම්භ වන ගංගාවක නමක් ලියන්න.

ii. "B" අක්ෂරයෙන් දක්වා ඇති භූ විෂමතා කලාපය කුමක් ද? මෙම කලාපයේ පිහිටි පැරණි ම වනාන්තරය කුමක් ද?

iii. "C" වලින් දක්වා ඇති භූ විෂමතා කලාපයේ දක්නට ලැබෙන සානු දෙකක නම් ලියන්න.

iv. "D" අක්ෂරයෙන් දක්වා ඇති භූ විෂමතා කලාපයේ ශේෂ කඳු දෙකක් නම් කරන්න.

v "E" වලින් දක්වා ඇති භූ විෂමතා කලාපයේ දක්නට ලැබෙන භූ රූප දෙකක් ලියන්න.




(ලකුණු 2 × 5 = 10)

(ආ) සපයා ඇති ලෝක සිතියම උපයෝගි කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

i "A" සහ "B" අක්ෂරවලින් දක්වා ඇති සාගර දෙකෙහි නම් ලියන්න.

ii. "C" සහ "D" අක්ෂරවලින් දක්වා ඇති මහාද්වීප දෙක නම් කරන්න.

iii. "E" සහ "F" වලින් දක්වා ඇති ප්‍රදේශයේ පිහිටි නිවර්තන වර්ෂා වනාන්තර දෙක මොනවා ද?

iv "G" සහ "H" අක්ෂර වලින් දක්වා ඇති මුහුදු දෙක නම් කරන්න.

v "I" සහ "J" වලින් දක්වෙන තැනිතලා භූමි හඳුන්වන නම් ලියන්න.




(ලකුණු 2 × 5 = 10)

II කොටස

02

i ප්‍රධාන සිතියම් වර්ග දෙක නම් කරන්න

ii සිතියමකින් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න

iii ඔබේ පිරිවෙණෙහි පිහිටීම දක්වෙන දළ සිතියමක් අඳින්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03

i ලෝකයේ ජලය ව්‍යාප්තව ඇති ආකාර දෙකක් නම් කරන්න.

ii ජලයෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

iii ජලය සංරක්ෂණය කරගත හැකි ආකාරය කරුණු දෙක ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

ශ්‍රී ලංකාවේ පරිපාලන ධූරාවලිය තුළ කුඩාම සහ විශාලතම ඒකක නම් කරන්න.

i දකුණු පළාතට අයත් දිස්ත්‍රික්ක තුනක් නම් කරන්න.

ii ශ්‍රී ලංකාවේ පිහිටීම ආර්ථිකයට බලපා ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

පෘථිවි පරිභ්‍රමණය යන කුමක් ද?

i පෘථිවි ග්‍රහයාගේ පවතින සුවිශේෂී ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

ii විශ්වය පිළිබඳ බුදු දහමේ දැක්වෙන ඉගැන්වීම් කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

මෑත කාලයේ ගිනිරකුසාට බිලි වූ පෘථිවියේ පෙනහැල්ල ලෙස සලකණ වනාන්තරය කුමක් ද? එය පිහිටි රට කුමක් ?

ii වනාන්තරය වැදගත් වීමට බලපාන හේතු තුනක් දක්වන්න.

iii වනාන්තර සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

i වායුගෝලයේ අඩංගු ප්‍රධාන වායු වර්ග දෙකක් නම් කරන්න.

ii වායුගෝලයෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

iii වායු දූෂණය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2020

## Primary Piriven Year End Test - 2020

### ශ්‍රේණිය 03 /Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

භූගෝල විද්‍යාව I, II
Geography I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

භූගෝල විද්‍යාව I

විභාග අංකය ..........................

**සැලකිය යුතු යි :**

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ.

එක් එක් ප්‍රශ්නයට දී ඇති උපදෙස්වලට අනුකූල ව, සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

» 1 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

01. භූගෝල විද්‍යාව යනු ....................................................... පිළිබඳ ව හදාරන විෂයකි.
(අහස හා පොළොව/ ස්වාභාවික පරිසරය හා මානුෂ පරිසරය /පෘථිවිය හා පරිසරය)

02. බුදුරදුන් "පතිරූප දේස වාසෝච" යනුවෙන් දේශනා කළේ ........................................ සූත්‍ර දේශනාවේ දී ය.
(අග්ගඤ්ඤ/මහා මංගල /අරුණාවතීය)

03. ඔබගේ පිරිවෙන අයත්වන කුඩා ම පරිපාලන ඒකකය වන්නේ .................................... කොට්ඨාසයයි.
(ග්‍රාම නිලධාරී /ප්‍රාදේශීය ලේකම් /දිස්ත්‍රික් ලේකම්)

04. මුහුදු මට්ටමේ සිට ඉහළට යත්ම ක්‍රමයෙන් උෂ්ණත්වය අඩු වීම පරිසර ................................... ලෙස හැඳින්වේ.
(ආර්ද්‍රතාවය /උෂ්ණත්වය / පතනශීඝ්‍රතාවය)

05. ඔක්තෝම්බර්, නොවැම්බර්යන මාසවලදී ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන්නේ .............................. වර්ෂාවෙනි.

(මෝසම් /සංවහන /වාසුලි)

06. ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා දුර කිලෝ මීටර් ............................ කි.

(432km / 225km / 456km)

07. හිමාලය කඳු වැටිය හා කුන්ලුන්ෂාන් කඳු වැටිය අතර ......................................... සානුව පිහිටා ඇත.
(ඉරාන/ මොන්ගෝලියානු / ටිබෙට්)

08. ශ්‍රී ලංකාවේ විශාලතම ස්වාභාවික වරාය ලෙස ............................................ වරාය වැදගත් වේ.
(හම්බන්තොට /ත්‍රිකුණාමලය /කොළඹ)

09. පෘථිවි ආදර්ශ ගෝලයේ නැගෙනහිර දේශාංශ .......................... රේඛාව ශ්‍රී ලංකාවේ කොළඹ නගරය හරහා වැටී ඇත. ($79^0$/ $80^0$/ $81^0$)

10. ..................................... ගඟ ලෝකයේ විලකින් ආරම්භවන ප්‍රධාන ගංගාවකට නිදසුනකි.
(නයිල් / රයින් / තේම්ස්)

» **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් එක් එක් දී ඇති ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. සෞරග්‍රහ මණ්ඩලයේ විශාලතම ග්‍රහයා වන්නේ බ්‍රහස්පති ය. (නි/වැ)

12. හිරු එළිය, පස, ජලය හා වාතය ජෛව සංරචක වේ. (නි/වැ)

13. පෘථිවිය මතුපිට සිට කිලෝමීටර් 20- . 30ත් අතර ඕසෝන් ස්ථරය පිහිටා ඇත. (නි/වැ)

14. පෘථිවිය වර්ග කිලෝමීටර් මිලියන 510.1 ක් පමණ විශාල වේ. (නි/වැ)

15. පෘථිවි ආදර්ශ ගෝලයේ උතුරේ සිට දකුණට අක්ෂාංශ රේඛා ව්‍යාප්ත වේ. (නි/වැ)

» **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. පෘථිවිය භ්‍රමණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ........................................................ ඇති වේ.

17. ..................................... මහද්වීපය මිනිස්වාසයෙන් තොර හිම තට්ටුවලින් පිරී පවතින්නකි.

18. සිකුරු ග්‍රහයා පහන් තරුව, උදාන තරුව,සිකුරු තරුව හා ..................................... ලෙස ද හැඳින්වේ.

19. චන්ද්‍රයාගේ බලපෑම මත සාගර ජල මට්ටම ඉහළ නැගීම .............................................. ලෙස හැඳින්වේ.

20. ශ්‍රී ලංකාවේ භූමියෙන් 90% ක් ම නිර්මාණය වී ඇත්තේ භූ විද්‍යා ඉතිහාසයේ පැරණිතම යුගය වන ....................... ........................... යුගයේ ය.

» **අංක 21 සිට 36 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යයි. ගස්වල දලු හා මල් හට ගනී. මුළු පරිසරය ම ඉතා අලංකාර වේ. මෙම පාරිසරික ලක්ෂණ දක්නට ලැබෙන ඍතුව වන්නේ,

(1) වසන්ත ඍතුව යි. (2) සිසිර ඍතුව යි.
(3) ගිම්හාන ඍතුව යි. (4) සරත් ඍතුව යි. (........)

22. සාගර ජල තලයෙන් ඉහළට එසවී ඇති අති විශාල භූ ස්කන්ධ හඳින්වෙන්නේ කුමන නමකින් ද?

(1) දූපත් (2) මහද්වීප
(3) කඳුවැටි (4) අර්ධද්වීපය (........)

23. විශ්වයේ චක්‍රාවාට පිළිබඳ පැහැදිලි කරන බෞද්ධ සූත්‍රය මින් කුමක් ද?

(1) ලෝක තතු විඥාපන සූත්‍රය යි. (2) අග්ගඤ්ඤ සූත්‍රය යි.
(3) අරුණාවතී සූත්‍රය යි. (4) කරණීය මෙත්ත සූත්‍රය යි. (........)

24. පෘථිවිය සමන්විත ප්‍රධාන පද්ධති ඇතුළත් නිවැරදි පිළිතුර කුමක් ද?

(1) වායු ගෝලය, පරිවර්ති ගෝලය, ජල ගෝලය අපරිවර්ණ ගෝලය

(2) ජෛව ගෝලය, ශිලා ගෝලය, පරිවර්තී ගෝලය, ජල ගෝලය

(3) වායු ගෝලය, ජල ගෝලය, ශිලා ගෝලය ජෛව ගෝලය

(4) ජෛව ගෝලය, ශිලා ගෝලය, තාප ගෝලය, වායු ගෝලය (........)

25. භූගෝල විද්‍යාඥයාගේ ප්‍රධානතම තොරතුරු ගවේෂණය හා රැස් කර තැබීම සඳහා භාවිතා කරන උපකරණය කුමක් ද?

(1) පුස්තකාලය (2) සිතියම

(3) පරිගණකය (4) දත්ත පොත (........)

26. ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර්,

(1) 65510කි. (2) 65610කි.

(3) 65710කි. (4) 65520කි. (........)

27. වෙරළබඩ භූ ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

(1) ටොම්බෝලාව (2) දඹය

(3) ඩෙල්ටා (4) සානු (........)

28. සිතියම් විද්‍යාත්මක කරුණු ඇතුළත් මුල් ම ලෝක සිතියම නිර්මාණය කරන ලද්දේ,

(1) ටොලමි විසිනි. (2) හෙරඩෝටස් විසිනි.

(3) ස්ට්‍රාබෝ විසිනි. (4) ඉරැක්ටොතිනීස් විසිනි. (........)

29. ලෝකයේ පළලින් වැඩි ම ගංගාව වන්නේ,

(1) නයිල් ගංගාව යි. (2) ඇමසන් ගංගාව යි.

(3) ගංගානම් ගංගාව යි. (4) හොවැංහෝ ගංගාව යි. (........)

30. භූගෝල විද්‍යාවේ උපවිෂය ඡේත්‍රය නොවන්නේ මින් කුමක් ද?

(1) රසායන භූගෝල විද්‍යාව (2) ආර්ථික භූගෝල විද්‍යාව

(3) සමාජ භූගෝල විද්‍යාව (4) ජෛව භූගෝල විද්‍යාව (........)

31. ලෝකයේ කුඩාම සාගරය වන්නේ මින් කුමක් ද?

(1) ආක්ටික් සාගරය (2) අත්ලාන්තික් සාගරය

(3) ඉන්දියන් සාගරය (4) පැසිෆික් සාගරය (........)

32. සෘතුන්ගේ වෙනස් වීම් දක්වන බෞද්ධ දේශනාව කුමක් ද?

(1) මහා මංගල සූත්‍රය (2) සප්ත අපරිහානි ධර්ම

(3) නියාම ධර්ම (4) චක්කවත්තී සීහනාද සූත්‍රය (........)

33. ශ්‍රී ලංකාවේ පළාත් නවයෙන් විශාලතම පළාත කුමක් ද?

(1) ඌව පළාත (2) සබරගමු පළාත

(3) බස්නාහිර පළාත (4) උතුරු මැද පළාත (........)

34. ලොව විශාලතම දූපත වන්නේ මින් කුමක් ද?

(1) මැඩගස්කරය (2) බැෆින්

(3) ග්‍රීන්ලන්තය (4) අයිස්ලන්තය (........)

35. උස්කඳු දෙකක් අතර පිහිටි පටු නිම්නය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

(1) සානුවක් (2) කපොල්ල

(3) නෙරුව (4) කොත් කන්ද (........)

36. පෘථිවියේ විශාලතම භූ විෂමතා රූප පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර කුමක් ද?

(1) කඳු වැටි හා සානු (2) මහද්වීප හා සාගර

(3) අර්ධද්වීප හා දූපත් (4) තැනිතලා හා නිම්නි (........)

» **අංක 37 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු හතරෙන් එකක් කුමන හෝ හේතුවක් මත අනෙක් පිළිතුරු තුන හා නොගැළපේ. එම නොගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

37. (1) පෘථිවිය (2) බුධ

(3) සිකුරු (4) ප්ලූටෝ (........)

38. (1) සානුව (2) කපොල්ල

(3) දියඇල්ල (4) ටොම්බෝලාව (........)

39. (1) වායු ගෝලය (2) පරිවර්තී ගෝලය

(3) අපරිවර්තී ගෝලය (4) මෙසෝ ගෝලය (........)

40. (1) කබොල (2) ප්‍රාවරණය

(3) බාහිර හරය (4) හරය (........)

## මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2020

## Primary Piriven Year End Test - 2020

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

භූගෝල විද්‍යාව I, II
Geography I, II

භූගෝල විද්‍යාව II

සැලකිය යුතු යි :

i මෙම ප්‍රශ්න පත්‍රය I, II ලෙස කොටස් දෙකකින් යුක්ත ය.

ii I කොටසේ ප්‍රශ්න සියල්ලට හා II කොටසේ ප්‍රශ්න හරතකට පිළිතුරු සපයන්න.

iii පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

iv පිළිතුරු සැපයීමට ලබා දී ඇති ඇමුණුම් අංක 01 ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

---

### I කොටස

01. (අ) ඔබවෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම උපයෝගී කර ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I "A" අක්ෂරයෙන් දක්වා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?

ii. කැළණි ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

iii. උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක දැක්වෙන අක්ෂර දෙක කුමක් ද?

IV. මඩකලපුව ද්‍රෝණි මෝය දැක්වෙන අක්ෂරය කුමක් ද?

V පිදුරුතලාගල කඳු පන්තිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු $2 \times 5 = 10$)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම උපයෝගී කර ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I A අක්ෂරයෙන් දැක්වෙන ද්වීපත කුමක් ද?

ii. "රතු මුහුද" දැක්වෙන අක්ෂරය කුමක් ද?

iii. "ෆ්ලෝරිඩා අර්ධද්වීපය" දැක්වෙන අක්ෂරය කුමක් ද?

IV. F අක්ෂරයෙන් දැක්වෙන කඳු වැටිය කුමක් ද?

V G අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද?

(ලකුණු $2 \times 5 = 10$)

## II කොටස

02

I ටොලමිගේ ලෝක සිතියමෙහි ශ්‍රී ලංකාව දක්වා ඇත්තේ කුමන නමකින් ද?

ii. සිතියමක තිබිය යුතු ප්‍රධාන මූලිකාංග තුන සඳහන් කරන්න.

iii. ප්‍රධාන සිතියම් වර්ග දෙක නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03

I ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කරන්න.

ii. ගල් ඔය කඳු පන්තියෙන් ආරම්භ වන ගංගා තුනක් නම් කරන්න.

iii. සබරගමු කඳු පන්තිය ආශ්‍රිත ව දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04

I භ්‍රමණය හා පරිභ්‍රමණය යනු කුමක් දැ යි හඳුන්වන්න.

ii. පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන පාරිසරික වෙන් කම් දෙකක් හ පෘථිවි පරිභ්‍රමණය නිසා ඇති වන ප්‍රතිඵලයක් ලියන්න.

iii. පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය හේතුවෙන් ඇති වන වෙනස්කම් මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05

I ඕසෝන් ස්ථරයෙන් ඇති ප්‍රයෝජනයක් ලියන්න.

ii. පෘථිවිය සමන්විත වන ප්‍රධාන කොටස් හතර නම් කරන්න.

iii. ජලය මිනිසාට ප්‍රයෝජනවත් වන ආකාරය නිදසුන් දෙකක් අසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06

I දූපතක් හා අර්ධද්වීපයක් යනුවෙන් හඳුන්වන්නේ කුමක් දැ යි පැහැදිලි කරන්න.

ii. ගංගාවක් උපත ලැබීමට බලපාන සාධක තුනක් නම් කරන්න.

iii. මිනිසාගේ අසීමිත පරිභෝජනය රටාව නිසා ඇති වී තිබෙන පාරිසරික ගැටලු දෙකක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07

I විශ්වය පිළිබඳ කරුණු දක්වෙන බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න.

ii. සූර්යයා හා ග්‍රහලෝක හැරුණු විට සෞරග්‍රහ මණ්ඩලයේ ඇති වෙනත් ආකාශ වස්තූන් තුනක් නම් කරන්න.

iii. පෘථිවි ග්‍රහයාගේ සුවිශේෂ ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

08


I සිතියම් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දක්විය හැකි ය. ඒ මොනවා ද?

ii. ඔබගේ පිරිවෙන පිහිටා ඇති ප්‍රදේශයේ දක්නට ලැබෙන භූගෝලීය ලක්ෂණ තුනක් සඳහන් කරන්න.


iii. ඔබගේ පිරිවෙන පිහිටි භූමියේ ගොඩනැගිලි පිහිටා ඇති ආකාරය දක්වෙන දළ සිතියමක් නිර්මාණය කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

01. (ආ)




01. (ආ)



සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය පිරිවෙන් අධ්‍යාපන ශාඛාව -
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

වර්ෂාවසාන පරීක්ෂණය - 2021 )2022(
ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - I

**සැලකිය යුතුයි :**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට දී ඇති උපදෙස්වලට අනුකූලව, සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

➢ අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01. භූගෝල විද්‍යාව යනු ................................................. පිළිබඳව හදාරන විෂයකි.
(අහස හා පොළොව / ස්වාභාවික හා මානුෂ පරිසරය / පෘථිවිය හා පරිසරය)

02. බුදු රදුන් ''පතිරූප දේස වාසෝච'' යනුවෙන් දේශනා කළේ ................................................. සූත්‍ර දේශනාවේ දී ය.
(අග්ගඤ්ඤ / මහා මංගල / අරුණාවතී)

03. ඔබගේ පිරිවෙන අයත් වන කුඩාම පරිපාලන ඒකකය වන්නේ ................................................. කොට්ඨාසය යි.
(ග්‍රාම නිලධාරී / ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් ලේකම්)

04. පස නිර්මාණය වීමට බලපාන ප්‍රධාන සාධකය ලෙස ........................................... පාෂාණ හැඳින්විය හැකිය. (ජුරාසික් / ග්‍රැනයිට් / මව්)

05. කතරගම කන්ද, මිහින්තලේ කන්ද අයත් වන්නේ .................................... භූ විෂමතා කලාපයට යි.
(වෙරළබඩ / අභ්‍යන්තර / මධ්‍ය කඳුකරය)

06. සාගරයේ සිට බලන විට ගොඩබිම දෙසට අර්ධ කවාකාරව නෙරා ගිය කරදිය පිරුණු මුහුදු ප්‍රදේශ ............................................. ලෙස හඳුන්වයි.
(මුහුදු බොක්ක / මුහුදු කලපුව / මෝය)

07. ලවණ ජලයෙන් යුක්ත කුඩා ජල ප්‍රදේශ ................................. නමින් හඳුන්වයි.
(සාගර / විල් / මුහුදු)

08. ශ්‍රී ලංකාව ත්‍රැපෝබේන් යනුවෙන් නම් කර ඇත්තේ ........................................... විසින් ය.
(ස්ට්‍රොබෝ / ක්ලෝඩියස් ටොලමි / ෆර්ඩිනන්ට් ටොනිස්)

09. භූ විද්‍යාඥයින් විසින් පිළිගන්නා ආකාරයට ශ්‍රී ලංකා භූමිය නිර්මාණය වී ඇත්තේ ........................................... යුගයේ දී ය.
(මයෝසීන / ප්ලයිස්ටොසීන / ප්‍රාග් ක්‍රේම්බ්‍රීය)

10. ශ්‍රී ලංකාවේ නැගෙනහිර හා ගිනිකොණ දිග පහත් බිම්වල ........................................... ශ්‍රේණියට අයත් පාෂාණ පිහිටා ඇත.
(උස් බිම් / වන්නි / විජයානු)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් එක් එක් දී ඇති ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. පෘථිවිය මතුපිට සිට කිලෝමීටර් 20 - 30ත් අතර වායුගෝලයේ ඕසෝන් ස්තරය පිහිටා ඇත. ( නි / වැ )

12. පෘථිවිය වර්ග කිලෝමීටර් මිලියන 510.1 ක් පමණ විශාල වේ. ( නි / වැ )

13. පෘථිවි ආදර්ශ ගෝලයේ උතුරේ සිට දකුණට අක්ෂාංශ රේඛා ව්‍යාප්ත වේ. ( නි / වැ )

14. අඟහරු ග්‍රහයාට ඉරබටු තරුව යැයි කියනු ලැබේ. ( නි / වැ )

15. චක්‍රාවාටයක් හෙවත් මන්දාකිණිය ක එක් අංශුවක් ලෙස සෞරග්‍රහ මණ්ඩලය හැඳින්වේ. ( නි / වැ )

- **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. පෘථිවිය භ්‍රමණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ........................................... ඇති වේ.

17. ........................................... මහද්වීපය මිනිස් වාසයෙන් තොර හිම තට්ටුවලින් පිරී පවතින්නකි.

18. සිකුරු ග්‍රහයා, පහන් තරුව, උදාන තරුව, සිකුරු තරුව හා ........................................... ලෙස ද හඳුන්වයි.

19. භූගෝල විද්‍යාව සඳහා ඉංග්‍රීසි භාෂාවේ භාවිත වන Geography (ජොග්‍රැෆි) යන්න ........................................... භාෂාවෙන් බිඳී ආ වචනයකි.

20. පරිසරයේ මූලිකාංග ලෙස වායුගෝලය, ජලගෝලය, ශිලා ගෝලය සහ ........................................... හඳුනගෙන ඇත.

- **අංක 21 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු 4 අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යයි. ගස්වල දලු හා මල් හට ගනී. මුළු පරිසරයම ඉතා අලංකාර වේ. මෙම පාරිසරික ලක්ෂණ දක්නට ලැබෙන ඍතුව වන්නේ,
(1) වසන්ත ඍතුව යි. (2) සිසිර ඍතුව යි.
(3) ගිම්හාන ඍතුව යි. (4) සරත් ඍතුව යි. (...........)

22. සාගර ජල තලයෙන් ඉහළට එස වී ඇති විශාල භූ ස්කන්ධ,

(1) දූපත් ලෙස හඳුන්වයි. (2) මහද්වීප ලෙස හඳුන්වයි.

(3) කඳුවැටි ලෙස හඳුන්වයි. (4) අර්ධද්වීපය ලෙස හඳුන්වයි. (............)

23. විශ්වයේ චක්‍රාවාට පිළිබඳ පැහැදිලි කරන බෞද්ධ සූත්‍රය ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ලෝක ධාතු විඥාපන සූත්‍රය (2) අගඤ්ඤ සූත්‍රය

(3) අරුණාවතී සූත්‍රය (4) කරණීය මෙත්ත සූත්‍රය (............)

24. පෘථිවියේ ප්‍රධාන සංරචක නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) වායු ගෝලය, පරිවර්ති ගෝලය, ජල ගෝලය

(2) ජෛව ගෝලය, ශිලා ගෝලය, පරිවර්තී ගෝලය

(3) වායු ගෝලය, ජල ගෝලය, ශිලා ගෝලය

(4) ජෛව ගෝලය, ශිලා ගෝලය, තාප ගෝලය (............)

25. වෙරළබඩ භූ ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

(1) ටොම්බෝලා (2) දඹ (3) ඩෙල්ටා (4) සානු (............)

26. සිතියම් විද්‍යාත්මක කරුණු ඇතුළත් මුල්ම ලෝක සිතියම නිර්මාණය කරන ලද්දේ,

(1) ටොලමි විසිනි (2) හෙරඩෝටස් විසිනි

(3) ස්ට්‍රොබෝ විසිනි (4) ඉරැක්ටොතිනීස් විසිනි (............)

27. භූගෝල විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍රයක් නොවන්නේ,

(1) රසායන භූගෝල විද්‍යාව (2) ආර්ථික භූගෝල විද්‍යාව

(3) සමාජ භූගෝල විද්‍යාව (4) ජෛව භූගෝල විද්‍යාව (............)

28. සත්‍යන්ගේ වෙනස් වීම් දක්වන බෞද්ධ දේශනාව කුමක් ද?

(1) මහා මංගල සූත්‍රය (2) පරාභව සූත්‍රය

(3) නියාම ධර්ම (4) චක්කවත්ති සීහනාද සූත්‍රය (............)

29. ශ්‍රී ලංකාවේ පළාත් නවයෙන් විශාලතම පළාත කුමක් ද?

(1) ඌව පළාත (2) සබරගමු පළාත

(3) බස්නාහිර පළාත (4) උතුරු මැද පළාත (............)

30. පෘථිවියේ ඇති භූ විෂමතා ලක්ෂණවලින් විශාලම භූ විෂමතා ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) කඳුවැටි හා සානු (2) මහද්වීප හා සාගර

(3) අර්ධද්වීප හා දූපත් (4) තැනිතලා හා නිම්න (............)

31. සෞරග්‍රහ මණ්ඩලය සූර්යා ප්‍රධාන කොටගත් ග්‍රහලෝක,

(1) අටකින් හා තවත් අවකාශ වස්තු රැසකින් සමන්විත ය.

(2) නවයකින් හා චන්ද්‍රයාගෙන් සමන්විත ය.

(3) අටකින් හා චන්ද්‍රයා හා තාරකාවලින් සමන්විත ය.

(4) නවයකින් හා චන්ද්‍රයා හා තාරකාවලින් සමන්විත ය. (............)

32. සෞරග්‍රහ මණ්ඩලයේ පෘථිවිය දෙපස පිළිවෙලින් ඇති ග්‍රහලෝක යුගලය වන්නේ,

(1) සිකුරු සහ අඟහරු ය. (2) බ්‍රහස්පති සහ අඟහරු ය.

(3) අඟහරු සහ සිකුරු ය. (4) සිකුරු සහ බ්‍රහස්පති ය. (............)

33. සූර්යා ආලෝකය නිපදවන්නේ අභ්‍යන්තරයේ ඇති,

(1) හයිඩ්‍රජන් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි.

(2) නයිට්‍රජන් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි.

(3) හීලියම් වායුව හයිඩ්‍රජන් බවට පරිවර්තනය වීමෙනි.

(4) කාබන්ඩයොක්සයිඩ් වායුව හීලියම් බවට පරිවර්තනය වීමෙනි. (............)

34. 2006 වර්ෂයේ දී වාමන ග්‍රහයෙක් ලෙස නම් කෙරෙන්නේ,

(1) සෙනසුරු ග්‍රහයා ය. (2) බුධ ග්‍රහයා ය.

(3) යුරේනස් ග්‍රහයා ය. (4) ප්ලූටෝ ග්‍රහයා ය. (............)

35. සූර්යයාගේ සහ චන්ද්‍රයාගේ ඒකාබද්ධ ගුරුත්වාකර්ෂණය හේතුවෙන් සමුද්‍රයේ,

(1) සුනාමි තරංග ඇති වේ. (2) උදම් තරංග ඇති වේ.

(3) වඩදිය ඇති වේ. (4) බා දිය ඇති වේ. (............)

➢ **අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු හතරෙන් කුමන හෝ හේතුවක් මත අනෙක් පිළිතුරු තුන හා නොගැළපේ. එම නොගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

36. (1) පෘථිවිය (2) බුධ (3) සිකුරු (4) ප්ලූටෝ (............)

37. (1) සානුව (2) නිම්නය (3) නෙරුව (4) ද්වීපත (............)

38. (1) නැමි කඳු (2) ශේෂ කඳු (3) අයිස් කඳු (4) කුට්ටි කඳු (............)

39. (1) මහවැලි ගඟ (2) කැලණි ගඟ (3) නිල්වලා ගඟ (4) මල්වතු ඔය (............)

40. (1) කබොල (2) ප්‍රාවරණය (3) බාහිර හරය (4) හරය (............)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஉரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - *பிரிவேனா கல்விக் கிளை*
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - II

**සැලකිය යුතුයි :**

❖ **මෙම ප්‍රශ්න පත්‍රය I , II ලෙස කොටස් දෙකකින් යුක්තය. I කොටස අනිවාර්ය වේ. II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

### I කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ''A'' අක්ෂරයෙන් දක්වා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?
II. ''B'' අක්ෂරයෙන් දක්වා ඇති ගංගාව කුමක් ද?
III. ''C'' අක්ෂරයෙන් දක්වා ඇති සානුව කුමක් ද?
IV. ''D'' අක්ෂරයෙන් දක්වා ඇති ද්‍රෝණි මෝය කුමක් ද?
V. ''E'' අක්ෂරයෙන් දක්වා ඇති කඳු පන්තිය කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ''A'' අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?
II. ''B'' අක්ෂරයෙන් දැක්වෙන මුහුද කුමක් ද?
III. ''C'' අක්ෂරයෙන් දැක්වෙන අර්ධද්වීපය කුමක් ද?
IV. ''D'' අක්ෂරයෙන් දැක්වෙන කඳු වැටිය කුමක් ද?
V. ''E'' අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

### II කොටස

02. I. සිතියමක තිබිය යුතු මූලිකාංග 02 ක් නම් කරන්න.
II. ඉන් එක් මූලිකාංගයක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.
III. ප්‍රධාන සිතියම් වර්ග දෙක නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

03. I. ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප 02 ක් නම් කරන්න.

II. ඉන් එක් භූ විෂමතා කලාපයක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

III. භූ විෂමතාවය රටක ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

04. I. ද්වීපතක් හා අර්ධද්වීපයක් යනු කුමක් ද?

II. වායු ගෝලයේ ඇති ඕසෝන් ස්තරය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

III. පෘථිවියේ ව්‍යුහය නිරූපණය වන රූපසටහනක් ඇඳ කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

05. I. පෘථිවියේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 02 ක් නම් කරන්න.

II. ලෝකයේ ප්‍රධාන ඍතු හතර අතරින් 03 ක් නම් කරන්න.

III. ඍතු භේදය හේතුවෙන් පරිසරයේ සිදුවන වෙනස්කම් මිනිසාට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

06. I. ඔබ ජීවත් වන ප්‍රදේශයේ පරිසරය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

II. එහි ජීවත් වන ජනතාවගේ ජීවනෝපායන් පිළිබඳ පැහැදිලි කරන්න.

III. එම ප්‍රදේශයේ මානව කටයුතු හේතුවෙන් පරිසරයේ ඇති වී තිබෙන වෙනස්කම් පිළිබඳ පැහැදිලි කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

07. I. බුද්ධ දේශනාවේ ලෝක විෂය ගැන සඳහන් වී ඇති සූත්‍ර 02 ක් නම් කරන්න.

II. විශ්වය සහ සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ ව කෙටියෙන් විමසන්න.

III. ජලයෙන් ඇති ප්‍රයෝජන 03 ක් දක්වා, ජලය රැක ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

08. I. ශ්‍රී ලංකාවේ පළාත් කීයක් තිබේ ද?

II. එම පළාත් අතරින් 06 ක් නම් කරන්න.

III. ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ A, B, C, D, E ලෙස ලකුණු කර ඇති දිස්ත්‍රික්ක නම් කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)
ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)
Year End Term Test – 2021 (2022)


**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - II


විභාග අංකය ....................................................

❖ II පත්‍රයේ I කොටසේ 01. (අ) හා (ආ) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම කඩදාසිය යොදා ගන්න. මෙය ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

01. (අ)



01. (ආ)



සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**පැය තුනයි**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - I

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව, සියලු ම ප්‍රශ්නවල ට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ.**

➢ **අංක 01 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. පෘථිවි භ්‍රමණය සඳහා පැය 23 යි විනාඩි .................. ගත වේ. (54 ක් / 56 ක් / 58 ක් )

02. හිරුගෙන් ලැබෙන පාරජම්බුල කිරණ ......................................... වායුව මගින් උරා ගෙන ජීවීන්ට හිතකර පාරිසරික තත්ත්වයක් ඇති කරයි.
(නයිට්‍රජන් ($N_2$) / ඔක්සිජන් ($O_2$) / ඕසෝන් ($O_3$) )

03. සාගර ජල තලයෙන් ඉහළට නැගී ඇති විශාල භූ ස්කන්ධ ......................................... නම් වේ.
(අර්ධද්වීප / දූපත් / මහද්වීප)

04. වෙරළේ සිට ඉදිරියට පැතිරෙන නොගැඹුරු සාගරික කලාපය ......................................... ලෙස හැඳින්වේ. (මහද්වීපික තටකය / වෙරළ ඉම / සාගරික බෑවුම)

05. ශීත දේශගුණික කලාපයේ දක්නට ලැබෙන වනාන්තර ......................................... ලෙස හඳුන්වයි. (නිවර්තන වනාන්තර / සෞම්‍ය කලාපීය වනාන්තර / කේතුධර වනාන්තර)

06. කෝටි සංඛ්‍යාත චක්‍රාවාට ඒකරාශී වීමෙන් ......................................... සකස් වී ඇත.
(ක්ෂීරපථ / මන්දාකිණිය / විශ්වය)

07. ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් වෙන් වන 32km ක් පමණ පටු මුහුදු තීරය ......................................... සමුද්‍ර සන්ධිය නමින් හඳුන්වයි. (මලක්කා / පෝක් / ජිබ්‍රෝල්ටා)

08. සූර්යයා ප්‍රධාන කොට ගත් ග්‍රහයන් සහ තවත් ආකාශ වස්තු සමූහයකගෙන් සමන්විත අවකාශය ............................................ ලෙස හඳුන්වයි. (විශ්වය / සෞරග්‍රහ මණ්ඩලය / චක්‍රාවාටය)

09. ග්‍රීක ජාතික ටොලමි විසින් අඳින ලද ලෝකයේ මුල් ම සිතියමේ ............................................ යනුවෙන් ශ්‍රී ලංකාව හඳුන්වන ලදී. (සීලන් / සිලෝන් / තැප්‍රොබේන්)

10. ඉරබටු තරුව, පහන් තරුව යන නම් වලින් ............................................ ග්‍රහයා හඳුන්වයි. (බුධ / සිකුරු / පෘථිවි)

➢ **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් එක් එක් දී ඇති ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. භූගෝල විද්‍යාව යනු පෘථිවිය පිළිබඳ හදාරන විෂයකි. ( නි / වැ )

12. පෘථිවිය පරිභ්‍රමණය වීම නිසා දිවා රාත්‍රී ඇති වේ. ( නි / වැ )

13. ග්‍රීෂ්ම හෙවත් ගිම්හාන ඍතුවේ දී දිවා කාලය දිගු වන අතර රාත්‍රිය කෙටි ය. ( නි / වැ )

14. වායුගෝලයේ අන්තර්ගත වායු වර්ග අතුරින් නයිට්‍රජන් ($N_2$) හරිත ශාක වර්ධනයට උපකාරී වේ. ( නි / වැ )

15. පාෂාණ ජීර්ණයට බලපාන සාධක අතරින් ජලය ප්‍රධාන සාධකයක් නොවේ. ( නි / වැ )

➢ **අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසර ............................................ බිඳ වැටීම සිදු වේ.

17. පෘථිවිය තමා වටා හෙවත් තම අක්ෂය වටා කැරකීම ............................................ ලෙස හඳුන්වයි.

18. පෘථිවි ආදර්ශ ගෝලය වටා ඇති මනඃකල්පිත කොටු දැල අක්ෂාංශ හා ............................................ ලෙස හඳුන්වයි.

19. වර්ෂයක සුවිශේෂී කාලගුණික තත්ත්වයක් පවතින කාලපරිච්ඡේදයක් ............................................ ලෙස හඳුන්වයි.

20. නිවර්තන කලාපයේ වියළි හා ............................................ වශයෙන් ඍතු දෙකක් හඳුනාගත හැකිය.

➢ **අංක 21 සිට 35 දක්වා ප්‍රශ්නවල ට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. භූගෝල විද්‍යාත්මකව පරිසරය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. එනම්,
   (1) භෞතික පරිසරය සහ සංස්කෘතික පරිසරය
   (2) භෞතික පරිසරය සහ ස්වභාවික පරිසරය
   (3) සංස්කෘතික පරිසරය සහ මානුෂ පරිසරය
   (4) ජීවී පරිසරය සහ අජීවී පරිසරය (...........)

22. පෘථිවිය තම අක්ෂය වටා භ්‍රමණය වන්නේ,

(1) නැගෙනහිර සිට බටහිරට ය. (2) බටහිර සිට නැගෙනහිරට ය.
(3) උතුරේ සිට දකුණට ය. (4) දකුණේ සිට උතුරට ය. (............)

23. ''උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු වී යයි. ගස්වල පත්‍ර පතනය වීම සිදු වේ. මුළු පරිසරය ම වියළි බවක් පෙන්වයි.'' මෙම ලක්ෂණ දක්නට ලැබෙන්නේ,

(1) සිසිර ඍතුවේ දී ය. (2) වසන්ත ඍතුවේ දී ය.
(3) ග්‍රීෂ්ම ඍතුවේ දී ය. (4) සරත් ඍතුවේ දී ය. (............)

24. ලොව විශාලතම මහද්වීපය වන්නේ,

(1) ඕස්ට්‍රේලියා මහද්වීපය යි. (2) යුරෝපා මහද්වීපය යි.
(3) අප්‍රිකා මහද්වීපය යි. (4) ආසියා මහද්වීපය යි. (............)

25. සෞරග්‍රහ මණ්ඩලයේ විශාලත ම ග්‍රහලෝකය සහ උපග්‍රහයන් වැඩිම ග්‍රහලෝකය,

(1) සෙනසුරු ය. (2) අඟහරු ය. (3) සිකුරු ය. (4) බ්‍රහස්පති ය. (............)

26. ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැනිතලාවේ දක්නට ලැබෙන භූ රූපයක් නොවන්නේ,

(1) දූපත් ය. (2) ඩෙල්ටා ය. (3) වගුරු ය. (4) සානු ය. (............)

27. සෞරග්‍රහ මණ්ඩලයේ පෘථිවිය දෙපස ඇති ග්‍රහලෝක දෙක වන්නේ,

(1) බුධ සහ බ්‍රහස්පති ය. (2) සිකුරු සහ සෙනසුරු ය.
(3) සිකුරු සහ අඟහරු ය. (4) අඟහරු සහ බ්‍රහස්පති ය. (............)

28. ''බලන'' කපොල්ල හරහා වැටී ඇති මහා මාර්ගය වන්නේ,

(1) කුරුණෑගල - මහනුවර මාර්ගය යි. (2) කොළඹ - මහනුවර මාර්ගය යි.
(3) මාතලේ - මහනුවර මාර්ගය යි. (4) අවිස්සාවේල්ල - නුවරඑළිය මාර්ගය යි.
(............)

29. ශ්‍රී ලංකාවේ පැරණිත ම වනාන්තරය වන සිංහරාජ වනාන්තරය පිහිටා ඇත්තේ,

(1) සබරගමු කඳු පන්තියේ ය. (2) ගල්ඔය කඳු පන්තියේ ය.
(3) නකල්ස් කඳු පන්තියේ ය. (4) නමුණුකුල කඳු පන්තියේ ය. (............)

30. 1 : 50 000 මෙට්‍රික් සිතියමක සැබෑ භූමියේ කි.මී. 1 ක් දැක්වෙන්නේ,

(1) සෙන්ටිමීටර් 1 කිනි. (2) සෙන්ටිමීටර් 2 කිනි.
(3) සෙන්ටිමීටර් 3 කිනි. (4) සෙන්ටිමීටර් 4 කිනි. (............)

31. ගල්ඔය කඳු පන්තියට අයත් කඳු ගැටයක් නොවන්නේ,

(1) ගෝවින්ද හෙළ ය. (2) ඉඟිනියාගල ය.
(3) ගොන්ගල ය. (4) කොකාගල ය. (............)

32. සිතියමක නිල් පාටින් දැක්වෙන්නේ,

(1) ජලය හා බැඳුණු ලක්ෂණයන් ය. (2) සියලු ම ගෙවතු ය.

(3) වී වගා ප්‍රදේශයන් ය. (4) සියලු ම මාර්ගයන් ය. (............)

33. වෙරළ තීරයක දක්නට ලැබෙන භූ ලක්ෂණයක් නොවන්නේ,

(1) ඩෙල්ටා ය. (2) ද්‍රූපත් ය. (3) තුඩු ය. (4) බොකු ය. (............)

34. භෞතික තොරතුරු දැක්වෙන තේමා සිතියමක් නොවන්නේ,

(1) භූ විෂමතා සිතියම් ය.

(2) විවිධ වගාවන් දැක්වෙන සිතියම් ය.

(3) දේශගුණික ලක්ෂණ දැක්වෙන සිතියම් ය.

(4) ස්වභාවික වෘක්ෂලතා කලාප දැක්වෙන සිතියම් ය. (............)

35. තමා විසින් ම ආලෝකය නිකුත් කරන ආකාශ වස්තු හඳුන්වන්නේ,

(1) වල්ගා තරු නමින් ය. (2) චන්ද්‍රයා නමින් ය.

(3) තරු නමින් ය. (4) උල්කාපාත නමින් ය. (............)

➢ **අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු හතරෙන් එකක් කුමන හෝ හේතුවක් මත අනෙක් පිළිතුරු තුන හා නොගැළපේ. එම නොගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

36. (1) ගං මෝය (2) ඩෙල්ටාව (3) අපශාඛා (4) ටොම්බෝලාව (............)

37. (1) පිදුරුතලාගල කඳු පන්තිය (2) නමුණුකුල කඳු පන්තිය

(3) සමනල කඳු පන්තිය (4) සබරගමු කඳු පන්තිය (............)

38. (1) මහවැලි ගඟ (2) කළු ගඟ (3) කැළණි ගඟ (4) ගිං ගඟ (............)

39. (1) රිටිගල කන්ද (2) දිඹුලාගල කන්ද (3) කොකාගල කන්ද (4) ඇතුගල කන්ද (............)

40. (1) විපරීත පාෂාණ (2) ප්‍රාග් ක්‍රේම්බ්‍රීය පාෂාණ

(3) මයෝසීන පාෂාණ (4) ජුරාසික පාෂාණ (............)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - II

සැලකිය යුතුයි :

❖ **මෙම ප්‍රශ්න පත්‍රය I , II ලෙස කොටස් දෙකකින් යුක්තය. I කොටස අනිවාර්ය වේ. II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

### I කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (සිතියම සහ පිළිතුරු සපයන කොළය ලබා දී ඇත.)

I. ''A'' අක්ෂරයෙන් දක්වා ඇති පළාත කුමක් ද?

II. ''B'' අක්ෂරයෙන් දක්වා ඇති ගංගාව කුමක් ද?

III. ''C'' අක්ෂරයෙන් දක්වා ඇති කඳු පන්තිය කුමක් ද?

IV. ''D'' අක්ෂරයෙන් දක්වා ඇති කලපුව කුමක් ද?

V. ''E'' අක්ෂරයෙන් දක්වා ඇති දූපත කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (සිතියම සහ පිළිතුරු සපයන කොළය ලබා දී ඇත.)

I. ''A'' අක්ෂරයෙන් දැක්වෙන කඳු වැටිය කුමක් ද?

II. ''B'' අක්ෂරයෙන් දැක්වෙන ගංගාව කුමක් ද?

III. ''C'' අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?

IV. ''D'' අක්ෂරයෙන් දැක්වෙන වනාන්තරය කුමක් ද?

V. ''E'' අක්ෂරයෙන් දැක්වෙන රට කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

## II කොටස

02. I. භූගෝල විද්‍යාව යන්න නිර්වචනය කරන්න.

II. භූගෝල විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න.

III. භූගෝල විද්‍යාව විෂය හැදෑරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන **තුනක්** විස්තර කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

03. I. පෘථිවි භ්‍රමණය යනු කුමක් ද?

II. පෘථිවි පරිභ්‍රමණය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

III. පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය නිසා සිදු වන වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

04. I. ස්වභාවික වෘක්ෂලතා ප්‍රධාන වර්ග තුනකි. ඉන් **දෙකක්** නම් කරන්න.

II. ප්‍රධාන දේශගුණික කලාප අනුව ව්‍යාප්ත වී ඇති වනාන්තර වර්ග **තුන** නම් කරන්න.

III. වනාන්තරයකින් ලබා ගත හැකි ආර්ථික වටිනාකම් පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

05. I. සාගර සහ මුහුදු අතර වෙනස පැහැදිලි කරන්න.

II. වර්ෂා ජලයෙන්, උල්පතකින් සහ විලකින් ආරම්භ වන ගංගා **තුනක්** පිළිවෙළින් නම් කරන්න.

III. පෘථිවියේ සංයුතිය දැක්වෙන රූපසටහනක් ඇඳ, කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

06. I. විශ්වය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

II. සෞරග්‍රහ මණ්ඩලය රූපසටහනකින් නිරූපණය කරන්න.

III. අප ජීවත් වන පෘථිවියේ සුවිශේෂීතාවය පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

07. I. ශ්‍රී ලංකාව පිහිටා ඇති අක්ෂාංශ හා දේශාංශ අගයන් ලියන්න.

II. ශ්‍රී ලංකාවේ භූමියෙන් 90% ක් ම නිර්මාණය වී ඇති ප්‍රාග් කේම්බ්‍රිය පාෂාණවල වර්ග **තුන** නම් කරන්න.

III. ශ්‍රී ලංකාවේ පිහිටීම රටේ ආර්ථිකයට උපයෝගී කර ගත හැකි ආකාරය පිළිබඳව විමසන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

08. I. සිතියමක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

II. සිතියමක මූලිකාංග **තුනක්** නම් කරන්න.

III. වෙරළ තීරයේ දක්නට ලැබෙන භූ රූප **දෙකක්** ඇඳ, කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 02 + 03 + 05 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන පරීක්ෂණය - 2022 (2023)**

ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)

Year End Term Test – 2022 (2023)


**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

**භූගෝල විද්‍යාව - II**


**විභාග අංකය** ..................................................

- II පත්‍රයේ I කොටසේ 01. (අ) හා (ආ) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම කඩදාසිය යොදා ගන්න. මෙය ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

01. (අ)



01. (ආ)



සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන පරීක්ෂණය - 2022 (2023)**
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

**භූගෝල විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - II

**විභාග අංකය** ....................................................

❖ II පත්‍රයේ I කොටසේ 01. (අ) ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා මෙම කඩදාසිය යොදා ගන්න. මෙය ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

01. (අ) i. ....................................................................................................

ii. ....................................................................................................

iii. ....................................................................................................

iv. ....................................................................................................

v. ....................................................................................................

/ 5

01. (ආ) i. ....................................................................................................

ii. ....................................................................................................

iii. ....................................................................................................

iv. ....................................................................................................

v. ....................................................................................................

/ 5 / 10

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 10 | S | I, II |
|---|---|---|

පැය තුනයි

## මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

**3 ශ්‍රේණිය**

**(10) භූගෝල විද්‍යාව - I, II**

අමතර කියවීම් කාලයය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### භූගෝල විද්‍යාව I පත්‍රය

**සැලකිය යුතුයි :**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතය. (ලකුණු 1 × 40 = 40).
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු

➢ **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. පිරිවෙන පිහිටා ඇති කුඩා ම පරිපාලන ඒකකය වන්නේ, ........................................ යි. **(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය , ග්‍රාම නිළධාරී කොට්ඨාසය , පළාත)**

02. Geography (භූගෝල විද්‍යාව) යන පදය ........................................ භාෂාවෙන් බිඳී ආවකි. **(ග්‍රීක , අරාබි , ඉංග්‍රීසි)**

03. පරිගණක විද්‍යාව, භූගෝල විද්‍යාවේ ........................................ විෂයකි. **(උප , ප්‍රධාන , කාලීන)**

04. පෘථිවිය තමා වටා හෙවත් තම අක්ෂය වටා කැරකීම ........................................ ලෙස හඳුන්වයි. **(පරිභ්‍රමණය , භ්‍රමණය , ක්‍රියාකාරීත්වය)**

05. පෘථිවියේ අංශක ........................................ ආනතියක් ඇත. ( $23\frac{1^0}{2}$ , $66\frac{1^0}{2}$ , $90\frac{1^0}{2}$ )

06. පෘථිවි ආදර්ශ ගෝලයේ නැගෙනහිර සිට බටහිරට, තිරස් අතට විහිදෙන මනඃකල්පිත රේඛා ........................................ ලෙස හඳුන්වයි. **(දේශාංශ , අක්ෂාංශ , ජාත්‍යන්තර දින රේඛාව)**

07. පෘථිවියට එක් වටයක් භ්‍රමණය වීමට පැය විසි තුනයි මිනිත්තු ........................................ ගත වේ. **(56 ක් , 54 ක් , 52 ක්)**

08. වර්ෂයක සුවිශේෂී කාලගුණික තත්ත්වයක් පවතින කාල පරිච්ඡේදයක් ........................................ ලෙස හඳුන්වයි. **(දේශගුණික කලාපයක් , ඍතුවක් , පද්ධතියක්)**

09. සාගර ජලතලයෙන් ඉහළ ට නැගී ඇති විශාල භූ ස්කන්ධ ........................................ නම් වේ. **(අර්ධද්වීප , දූපත් , මහාද්වීප)**

10. පෘථිවියේ සම්පූර්ණ භූමි ප්‍රමාණයෙන් ........................................ ගොඩබිම් ය. **(21% , 29% , 71%)**

➢ **අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. පෘථිවි ගෝලයේ කරදියෙන් පිරී ගිය විශාල අවපාත සාගර හෙවත් ජල නිධි ලෙස හඳුන්වයි. ( නි / වැ )

12. මරියානා අගාධය ලෝකයේ ගැඹුරුම සාගරික අගාධය වේ. ( නි / වැ )

13. ලෝකයේ විශාල ම සාගරය අත්ලාන්තික් සාගරය යි. ( නි / වැ )

14. පැති තුනකින් සාගර ජලයෙන් වට වී ඇති භූ ස්කන්ධය කලපුවකි. ( නි / වැ )

15. ලොව උසින් වැඩි ම කඳු වැටිය හිමාලය කඳුවැටිය යි. ( නි / වැ )

➢ **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. කඳුකර භූමි ප්‍රදේශයක පිහිටා ඇති තැනිතලා ප්‍රදේශයක් .................................................................... ලෙස හඳුන්වයි.

17. සමාන උන්නතාංශයකින් යුතු, විශාල භූමි ප්‍රදේශයක පැතිරී ඇති බිම් .................................................................... ලෙස හඳුන්වයි.

18. ලෝකයේ පළලින් වැඩි ම ගංගාව .................................................................... ගංගාව යි.

19. ගොඩබිමෙහි ඇති ප්‍රමාණයෙන්, හැඩයෙන්, උපතින් එකිනෙකට වෙනස් වූ ජලයෙන් පිරි විශාල අවපාත .................................................................... ලෙස හඳුන්වයි.

20. කොංගෝ, ඇමර්ෂන් යන වනාන්තර, නිවර්තන .................................................................... වනාන්තරවලට උදාහරණ වේ.

➢ **අංක 21 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.**

21. සූර්යයාට කිට්ටුම ග්‍රහලෝකය වන්නේ,
(1) බුධ (2) සිකුරු (3) පෘථිවි (4) අඟහරු (...........)

22. අභ්‍යන්තර ග්‍රහලෝක ගණන වන්නේ,
(1) දෙක කි. (2) පහ කි. (3) තුන කි. (4) හතර කි. (...........)

23. පහන් තරුව, උදා තරුව, ලෙස හඳුන්වන ග්‍රහලෝකය වන්නේ,
(1) සිකුරු ග්‍රහයා ය. (2) අඟහරු ග්‍රහයා ය. (3) බුද ග්‍රහයා ය. (4) බ්‍රහස්පති ග්‍රහයා ය. (...........)

24. බ්‍රහස්පති ග්‍රහයාට උපග්‍රහයන් කීයක් තිබේ ද?
(1) පනහ කි. (2) විසිහත කි. (3) හැටතුන කි. (4) අසූව කි. (...........)

25. හැලීගේ වල්ගා තරුව පෘථිවියට දිස්වන්නේ අවුරුදු කීයකට වරක් ද?
(1) 76 කට වරක් (2) 28 කට වරක් (3) 50 කට වරක් (4) 80 කට වරක් (...........)

26. ප්ලුටෝ ග්‍රහලෝකයක් නොවන බව තීරණය කරනු ලැබුවේ,
(1) 2006 දී ය. (2) 2008 දී ය. (3) 2000 දී ය. (4) 2010 දී ය. (...........)

27. ශ්‍රී ලංකාවේ උපරිම පළල වන්නේ,
(1) 432 km කි. (2) 224 km කි. (3) 320 km කි. (4) 124 km කි. (...........)

28. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර දුර වන්නේ,
(1) 32 km කි. (2) 30 km කි. (3) 28 km කි. (4) 24 km කි. (............)

29. රටක පිහිටීම දක්වන ආකාර,
(1) දෙකක් ඇත. (2) තුනක් ඇත. (3) හතරක් ඇත. (4) පහක් ඇත. (............)

30. භූ විද්‍යා ඉතිහාසයේ පැරණිම යුගය කුමක් ද?
(1) මයෝසීන යුගය යි. (2) ජුරාසික යුගය යි.
(3) පාෂාණ යුගය යි. (4) ප්‍රාග් කේම්බ්‍රීය යුගය යි. (............)

31. ශ්‍රී ලංකාවේ ජුරාසික පාෂාණ ඇති ප්‍රදේශයක් වන්නේ,
(1) තබ්බෝව ය. (2) මාතලේ ය. (3) කතරගම ය. (4) පොලොන්නරුව ය. (............)

32. සාගරය සමඟ ඍජුව සම්බන්ධ නොවන, රට ඇතුළත පිහිටා ඇති, කරදියෙන් පිරුණු ජලාශ හඳුන්වන්නේ,
(1) විල් යනුවෙනි. (2) ලේවා යනුවෙනි. (3) වගුරු යනුවෙනි. (4) ඩෙල්ටා යනුවෙනි. (............)

33. ශ්‍රී ලංකාවේ මීටර් 30 ත්, මීටර් 300 ත් අතර උච්චත්වයක් සහිත බිම් ප්‍රදේශය හඳුන්වන්නේ,
(1) සබරගමු කඳුවැටිය ලෙස ය. (2) අභ්‍යන්තර තැනිතලාව ලෙස ය.
(3) වෙරළබඩ තැනිතලාව ලෙස ය. (4) මධ්‍යම කඳුකරය ලෙස ය. (............)

34. ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාපවලින් ඩෙල්ටා ලක්ෂණය දැකිය හැකි වන්නේ,
(1) වෙරළබඩ තැනිතලාවේ ය. (2) අභ්‍යන්තර තැනිතලාවේ ය.
(3) මධ්‍යම කඳුකරයේ ය. (4) සබරගමු කඳුකරයේ ය. (............)

35. මධ්‍යම කඳුකරයේ පිහිටා ඇති ප්‍රධාන කඳු පන්ති ගණන වන්නේ,
(1) පහ කි. (2) තුන කි. (3) හතර කි. (4) හය කි. (............)

36. මුල් ම ලෝක සිතියම නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ක්ලෝඩියස් ටොලමි (2) ස්ට්‍රාබෝ
(3) ඇනෙක්ෂිමෙන්ඩර් (4) ඉරැටොස්තිනිස් (............)

37. සිතියමක මූලිකාංගයක් වන්නේ,
(1) දිග ය. (2) පළල ය. (3) වර්ගඵලය යි. (4) පරිමාණය යි. (............)

38. දූණුවිල භූ ලක්‍ෂණය දැකිය හැක්කේ,
(1) ගංගා ආශ්‍රිතව යි. (2) නිම්න ආශ්‍රිතව යි.
(3) නෙරු ආශ්‍රිතව යි. (4) කඳුවැටි ආශ්‍රිතව යි. (............)

39. සිතියම්ගත තොරතුරු හා වෙනත් ලක්‍ෂණ අනුව සිතියම් බෙදා දැක්විය හැකි කොටස් ගණන වන්නේ,
(1) තුන කි. (2) හතර කි. (3) පහ කි. (4) දෙක කි. (............)

40. 1:50,000 පරිමාණයේ සිතියම්වල දී සැබෑ භූමියේ කිලෝමීටර් එකක දුර පෙන්වීමට සෙන්ටිමීටර් කීයක් භාවිතා කරන්නේ ද?
(1) සෙන්ටිමීටර් 01 කි. (2) සෙන්ටිමීටර් 02 කි.
(3) සෙන්ටිමීටර් 03 කි. (4) සෙන්ටිමීටර් 04 කි. (............)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 10 | S | I, II |
|---|---|---|

**මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**

**3 ශ්‍රේණිය**

**(10) භූගෝල විද්‍යාව - I, II**

**සැලකිය යුතුයි :**

* මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස වශයෙන් කොටස් දෙකකින් යුක්තය.

* I කොටස අනිවාර්යය වේ. (ඇමුණුම් ලබා දී ඇත.)

* II කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම උපයෝගී කර ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. 'A' අක්ෂරයෙන් දක්වා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?
ii. 'B' අක්ෂරයෙන් දක්වා ඇති ගංගාව කුමක් ද?
iii. 'C' අක්ෂරයෙන් දක්වා ඇති සානුව කුමක් ද?
iv. 'D' අක්ෂරයෙන් දක්වා ඇති තුඩුව කුමක් ද?
v. 'E' අක්ෂරයෙන් දක්වා ඇති දූපත කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම උපයෝගී කර ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. 'A' අක්ෂරයෙන් දක්වා ඇති රට කුමක් ද?
ii. 'B' අක්ෂරයෙන් දක්වා ඇති ගංගාව කුමක් ද?
iii. 'C' අක්ෂරයෙන් දක්වා ඇති සාගරය කුමක් ද?
iv. 'D' අක්ෂරයෙන් දක්වා ඇති කඳු වැටිය කුමක් ද?
v. 'E' අක්ෂරයෙන් දක්වා ඇති දේශාංශය කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

## II කොටස

02. (i) භූගෝල විද්‍යාවේ උපවිෂය ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔබ ජීවත් වන පාරිසරික කලාපය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 03)

(iii) භෞතික හා සංස්කෘතික පරිසරය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

03. (i) පෘථිවි භ්‍රමණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) පෘථිවි ආදර්ශ ගෝලයක් ඇඳ, එහි ප්‍රධාන අක්ෂාංශ රේඛා හත ලකුණු කර නම් කරන්න. (ලකුණු 03)

(iii) පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය නිසා ඇතිවන පාරිසරික වෙනස්කම් පිළිබඳ පැහැදිලි කරන්න.

(ලකුණු 05)

04. (i) පෘථිවි වායුගෝලයේ වැඩිපුරම දක්නට ලැබෙන වායු වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) වායුගෝලයේ ස්තර රූප සටහනකින් නිරූපණය කරන්න. (ලකුණු 03)

(iii) වායුව දූෂණය වන ආකාරය විස්තරකර, එමගින් මිනිසාට ඇති කරන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. (i) ප්‍රධාන ඍතු හතරෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඍතුන්ගේ වෙනස්වීම මිනිසාගේ ආර්ථික කටයුතු සඳහා බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) පෘථිවි ආදර්ශ ගෝලයක් ඇඳ ප්‍රධාන දේශගුණික කලාප තුන නිරූපණය කරන්න. (ලකුණු 05)

06. (i) සිතියමක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) සිතියමක තිබිය යුතු මූලිකාංග දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සිතියමකින් ලබා ගත හැකි ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 05)

07. (i) ලෝකයේ කුඩා ම හා විශාල ම මහාද්වීපය නම් කරන්න. (ලකුණු 02)

(ii) දූපතක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 03)

(iii) ලෝකයේ ප්‍රධාන සාගර පහ නම් කරන්න. (ලකුණු 05)

08. (i) විශ්වය යනු කුමක්දැයි නිර්වචනය කරන්න. විශ්වය යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) සූර්යා හා ග්‍රහලෝක හැරුණු විට සෞරග්‍රහ මණ්ඩලයේ ඇති වෙනත් ආකාශ වස්තු තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සෞරග්‍රහ මණ්ඩලය රූප සටහනකින් නිරූපණය කරන්න. (ලකුණු 05)

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/ கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 10 | S | I, II |
|---|---|---|

## මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)
## 3 ශ්‍රේණිය
## (10) භූගෝල විද්‍යාව - I, II

**සැලකිය යුතුයි :**

* II ප්‍රශ්න පත්‍රයේ I කොටසේ 01. (අ) , (ආ) යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම කඩදාසිය යොදා ගන්න. මෙය ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

**විභාගඅංකය :** ........................................................

I කොටස

01. **(අ)** i. .............................................................................................................................. | |

ii. .............................................................................................................................. | |

iii. .............................................................................................................................. | |

iv. .............................................................................................................................. | |

v. .............................................................................................................................. | |

/10

**(ආ)** i. .............................................................................................................................. | |

ii. .............................................................................................................................. | |


iii. .............................................................................................................................. | |

iv. .............................................................................................................................. | |

v. .............................................................................................................................. | |

/10

01. (අ)




01. (ආ)

